Berghof
Research Center
Forschungszentrum
for Constructive
für konstruktive
Conflict Management
Konfliktbearbeitung

ගැටුම් ව්‍යාවර්තනයේ නවතම තත්ත්වය තක්සේරු කිරීම: සෛද්ධාන්තික දෘෂ්ටිකෝණගත ප්‍රත්‍යවේක්ෂණ

කොර්ඩියුලා රයිමාන් (Cordula Reimann)

www.berghof-handbook.net

1. හැඳින්වීම 52

2. පර්යේෂණ වැඩසටහන/ පර්යේෂණ ප්‍රශ්න 53
   මූලාශ්‍ර සහ ගැටුම් ස්වභාවය 54
   තුන්වන පාර්ශව ගතිලක්ෂණ 55
   තුන්වන පාර්ශව මූලෝපායයන් 56

3. විවිධ ගැටුම් කළමනාකරණ ප්‍රවේශ 59
   ගැටුම් සමථය පිළිබඳ ප්‍රවේශය 61
   ගැටුම් නිරාකරණ ප්‍රවේශය 63
   ගැටුම් ව්‍යාවර්තන ප්‍රවේශය 65

4. උපයුක්ත න්‍යාය සහ පර්යේෂණ විධිවල කාර්යභාරය 71

5. පවතින ප්‍රශ්න සහ අභියෝග 80

6. ආශ්‍රිත ග්‍රන්ථ සහ වැඩිදුර කියවීම 80

©2006 Berghof Research Center for Constructive Conflict **Management**

ගැටුම් ව්‍යාවර්තනයේ නවතම තත්ත්වය තක්සේරු කිරීම: සෛද්ධාන්තික දෘෂ්ටිකෝණගත ප්‍රත්‍යවේක්ෂණ

කෝර්ඩියුලා රෙයිමන් (Cordula Reimann)

1. හැඳින්වීම

පහත එන විශ්ලේෂණයෙන් බලාපොරොත්තු වන්නේ සමස්ත ගැටුම් කළමනාකරණ සහ ගැටුම් ව්‍යාවර්තන ක්ෂේත්‍රයේ ව්‍යාප්තව පවතින්නා වූ අවිනිශ්චිත සංකල්පීය සහ නිර්වචනමය අවුල් ජාලය හරහා යා හැකි කිසියම් යොමුවක් ලබාදීමට ය. පසුව එන විස්තරය මගින් යෝජනා කරනු ලබන්නේ උපරිම තරමින් එක්තරා භව්‍යමාන එහෙයින් අවිනිශ්චිත වූ නවතම තත්ත්වය පිළිබිඹු වේයැයි සැලකිය හැකි අර්ථ කථනයකි. කෙසේ වුවද කතුවරයාගේ නිරීක්ෂණ විස්තර පූර්ණ ඒවාට වඩා හැඟවීමේ තත්ත්වයක පවතී.

මෙම විශ්ලේෂණයේ මෙහෙයුම් ප්‍රශ්නය වන්නේ ගැටුම් කළමනාකරණ සහ ගැටුම් ව්‍යාවර්තන ක්ෂේත්‍ර සංකල්පීය හා සෛද්ධාන්තිකය වශයෙන් සැලසුම් කරගන්නේ කෙසේද යන්නයි. මෙම ප්‍රශ්නය ගැටුම් කළමනාකරණ ක්ෂේත්‍රය පිළිබඳ සන්දර්භය තුළ දී පිළිගත හැකි ප්‍රවේශයන් තුනක් ඇසුරින් සාකච්ඡා කෙරේ: එම ප්‍රවේශ වන්නේ ගැටුම් සමනය, ගැටුම් නිරාකරණය සහ ගැටුම් ව්‍යාවර්තනයයි (I රූප සටහන බලන්න).

මෙම කර්තව්‍යයෙහි නියැලීමට පෙරාතුව ආරම්භක නිරීක්ෂණ කිහිපයක් සඳහන් කිරීම අවශ්‍ය වේ. පළමුවෙන්ම එහි බහු විෂයක ස්වභාවයක් තිබීම නැතිනම් සමහරවිට ඒ හේතුකොට ගෙන සමස්ත ගැටුම් කළමනාකරණ ක්ෂේත්‍රයම සංකල්පීය සහ නිර්වචන වශයෙන් අවිනිශ්චිත බවකින් වෙළී තිබීමයි. ශාස්ත්‍රීය ලේඛන බොහොමයක *ගැටුම් කළමනාකරණය, ගැටුම් නිරාකරණය* සහ *ගැටුම් ව්‍යාවර්තනය* යන යෙදුම් ඉතා ලිහිල් අන්දමින් සහ අවිශේෂයෙන් එකම මාදිලියේ ක්‍රමෝපායයන් සඳහා බොහෝ විට පාවිච්චි කරනු ලැබේ. ඒ ආකාරයෙන්ම හමුවිය හැකි තවත් යෙදුමක් වන්නේ සියලු ආකාරයේ තුන්වන පාර්ශ්ව මැදිහත්වීම් සඳහා යොදන ගැටුම්-සමනය යන්නයි. කෙටියෙන් සඳහන් කරන්නේ නම් සමස්ත ක්ෂේත්‍රය තුළ නිශ්චිත නොවන පාරිභාෂික පද භාවිතය (රොපර්ස් 1997) ව්‍යතිරේකයකට වඩා සාමාන්‍යය බවට පත් වී තිබේ: මූලික සංකල්ප සඳහා පවතින මෙකී නිර්වචනාත්මක අවිනිශ්චිත බව ක්‍රියාකාරීන් වැඩියෙන් සම්බන්ධවන විට නොනවත්වා වැඩිවෙයි.

ගැටුම් කළමනාකරණය යන යෙදුම ද බොහෝ දුරට අභාග්‍යවන්ත වන්නේ "කළමනාකරණ තර්කයෙන්" ඔබ්බට යන්නා වූ ගැටුම් ව්‍යාවර්තනය වැනි ප්‍රවේශ ද එයට ඇතුළත් වීමට ඉඩ ඇති හෙයිනි. කෙසේ වුවද වෙනත් විකල්පයක් නොමැති බැවින්, ගැටුම් කළමනාකරණය යන යෙදුම පොදු යෙදුමක් ලෙස මම පිළිගනිමි. ඒ අතරම එහි නිර්වචන සහ සංකල්ප හේතු කොට ගෙන අපහසු තත්ත්වයන්ට පත්වීමට ඇති අනතුරු ගැන අවවාද කරමි.

දෙවනුව, බොහෝ පිළිගත් විද්වත්හු ගැටුම් කළමනාකරණ ක්ෂේත්‍රයට විද්වත් මත සහ නියම සත්‍ය ගැටුම් කළමනාකරණ භාවිතය තුළින් විශේෂඥ දැනුම ගෙන එති. එහි ප්‍රතිඵලයක් වශයෙන් බොහෝ දෙනා සරල වර්ගීකරණ ප්‍රතික්ෂේප කරති. ඒ අතරම ඔවුන්ගේ කාර්ය හුදෙක් එකම ප්‍රවර්ගයකට අයත් වන්නේ නැත.

තුන්වෙනුව, විවිධාකාර වූ ප්‍රවේශයන්හි සංකීර්ණත්වය නොසලකා ගැටුම් කළමනාකරණ පර්යේෂණ ප්‍රජාව පසුගිය අවුරුදු 30 ඇතුළත එහි නවතම තත්ත්වය සමාලෝචනය කිරීමට ක්‍රියා කර ඇත්තේ අල්ප වශයෙනි, භාවිතයට යෝග්‍ය හඳුන්වාදීමේ පෙළපොත් සපයාදීමෙන් ක්ෂේත්‍රයේ විෂයාන්තර ස්වභාවය අවධාරණය කිරීමට පවා කටයුතු කර ඇත්තේ අල්ප වශයෙනි (ව්‍යතිරේක කිහිපයෙන් එකක් විය හැක්කේ, මියාල්, රම්ස්බොතම් සහ වුඩ් හවුස් 1999යි).

හතරවෙනුව, ප්‍රජා මැදිහත්වීම සහ විකල්ප ආරවුල් නිරාකරණය (ADR) වැනි පුද්ගල සහ කණ්ඩායම් පිළිබඳ ගැටුම් කළමනාකරණ පර්යේෂණ ජාත්‍යන්තර සම්බන්ධතා විෂයයෙහි ගැටුම් කළමනාකරණය පිළිබඳව ප්‍රධාන බලපෑමක් කර තිබුණි. තවද, වර්තමාන ප්‍රචණ්ඩ සහ කල් ඇදෙන බොහෝ ගැටුම්වල ස්වභාවය සලකා බලන කල අභ්‍යන්තර දේශීය ගැටුම හා බාහිර ජාත්‍යන්තර ගැටුම අතර ගැටුම් කළමනාකරණය වෙන් කර හඳුනා ගැනීම අතිශය අසීරු කරුණක් බවට පත් වේ. මෙම ගැටුම්වල කල් ඇදෙන ස්වභාවය කොතරම් ද යත්, අර්බුදය විවිධ කණ්ඩායම්වල සමාජ සහ දේශපාලන තත්ත්වයට අනුරූපව සාමාන්‍යයෙන් රටාගත වෙයි. ඊට අදාළ ලක්ෂණ වන්නේ, ඔවුන්ගේ භාෂාව, ආගම, ගෝත්‍ර සම්බන්ධකම්, දේශපාලන සහ සමාජ අනන්‍යතාව සහ ව්‍යූහයයි. ඒ අනුව, තරමක් දුරට ජාත්‍යන්තර කරළියේ සිදුවන්නා වූ කල් ඇදෙන ගැටුම් පිළිබඳව පහත දක්වෙන විශ්ලේෂණය අනිකුත් සමාජ තලයන්හි දී කරගෙන යනු ලබන අන්තර් කණ්ඩායම් ගැටුම් කළමනාකරණය සම්බන්ධයෙන් ද වලංගු විය හැකිය.

පහත එන විශ්ලේෂණයට අර්ථවත් පාදක ව්‍යූහයක් ලබාදීම සඳහා පළමුව එම පර්යේෂණ වැඩසටහන සහ පර්යේෂණ ප්‍රශ්නවලට යොමුවෙමි. ඊට පසු න්‍යායය සහ පර්යේෂණ ක්‍රමයන්හි කාර්යභාරය සමාලෝචනය කිරීම සඳහා ඉදිරියට යමි.

2. පර්යේෂණ වැඩසටහන / පර්යේෂණ ප්‍රශ්න

පොදු ගැටුම් කළමනාකරණ ක්ෂේත්‍රය න්‍යාය සහ අභ්‍යාස වශයෙන් ඉතා හොඳින් තේරුම් ගෙන ඇති පරිදි අතිශය සංකීර්ණ වූත් ඉතා පුළුල් විවිධත්වයකින් යුත් විෂයයන්ගෙන් සමන්විත වූත් බහු-විෂයානුබද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයකි. එයට අයත් වන විෂයයන් අතර ජාත්‍යන්තර නීතිය, මනෝ විද්‍යාව, දර්ශනය, සමාජ-ජීව විද්‍යාව, ජාත්‍යන්තර සම්බන්ධතා, ගැටුම්/ සාම පර්යේෂණ, දේශපාලන විද්‍යාව, ආර්ථික විද්‍යාව සහ සමාජයීය මානව-විද්‍යාව වෙයි. ජාත්‍යන්තර සබඳතා සහ සාම පර්යේෂණ පිළිබඳ ප්‍රත්‍යෙකයන්හි මෙන් කේවල වූ, ශාස්ත්‍ර සම්මත විෂය කරුණක් මෙහි නොමැත. විෂය ක්ෂේත්‍රයේ පුළුල් බව පමණක් නොව, අන්තර්-පුද්ගල තලයේ සිට ජාත්‍යන්තර තලය දක්වා පොදු සමාජ ප්‍රපඤ්චයක් වශයෙන් ගැටුම් කළමනාකරණයේ යොමුව ද සලකන විට මෙය පුදුමයට කරුණක් නොවේ.

අතීතයේ දී පර්යේෂණ වැඩි වශයෙන් යොමු වූයේ අන්තර් පුද්ගල, අන්තර් කණ්ඩායම් සහ ජාත්‍යන්තර ගැටුම් සම්බන්ධ සංදර්භ සහ ක්‍රියාවලි විචල්‍යයන් විශ්ලේෂණය කිරීමටය. ඒවා නම් *ගැටුමේ මූලාශ්‍ර සහ ස්වභාවය* මෙන්ම *තුන්වන පාර්ශවයේ ලක්ෂණ සහ ක්‍රමෝපායන්* වැනි ඒවායි. මේවා වඩා හොඳ ගැටුම් කළමනාකරණය සඳහා යෝග්‍ය වීමට ඉඩ තිබේ (නිදර්ශනයක් වශයෙන් බර්කෝවිච් සහ රුබින් 1992, පිටු 1-29 බලන්න). පසුගිය අවුරුදු තිහක කාලයේ දී මෙම කරුණු වටා ඇති වූ ප්‍රධාන පෙළේ සංවාද දෙස සංක්ෂිප්ත ලෙස බැලීමෙන් මෙය පැහැදිලි කරගත හැකිය.

2.1 මූලාශ්‍ර සහ ගැටුමේ ස්වභාවය

මෑතක් වනතුරු ගැටුමේ මූලාශ්‍ර සහ ස්වභාවය පිළිබඳ පර්යේෂණ සාමාන්‍යයෙන් කේන්ද්‍රගත වූයේ සත්භාව විචාරාත්මක හුය දෙකක් වටාය. එනම් ආත්මමූලක සහ විෂයමූලක ප්‍රවේශයන්ය. ගැටුම් කෙරෙහි ආත්මමූලක ප්‍රවේශය මූලික වශයෙන් යොමුවන්නේ අභිමතාර්ථ පිළිබඳ වූ සංජානනය කරගන්නා ලද අසංගතභාවයයි. මෙහි අවශ්‍ය අනුමාන වන්නේ, පළමුවෙන්, බොහෝ අභිමතාර්ථ ආත්මීය වශයෙන් අසංගත යයි සංජානනය කිරීමයි. එසේ වුවද විෂය මූලිකව බලන කල ඒවා අතිශයින්ම සංගත විය හැකිය. මෙසේ සිදුවන්නේ වැරදි තොරතුරු ලැබීම, සංස්කෘතික වශයෙන් අත්වන වැරදි අවබෝධය හෝ ප්‍රතිරූප, සැකය සහ චිත්තවේග ආතතිය වැනි වැරදි සංජානනයන් නිසා වන්නට ඇත. දෙවනුව ව්‍යුහාත්මක වශයෙන් අසාධාරණ හෝ යුක්ති සහගත නොවන සම්බන්ධතා බොහෝ විට පිළිගැනීමට ලක්වන්නේ නැති අතර, සහභාගීවන අයගෙන් අවම වශයෙන් එක් පාර්ශවයකවත් ඔවුන්ගේ පරායත්තතාව සහ අනික් අය අතින් සිදුවන සමාන නොවන සැලකිල්ල අවබෝධ කර ගැනීමට අසමත් වෙයි. මෙය 'තෘප්තිමත් වහලා' යන ප්‍රපඤ්චය ආශ්‍රයෙන් තහවුරු කළ හැකිය.

විෂයමූලක ප්‍රවේශය නිත්‍ය වශයෙන්ම සැලකිලිමත් වන්නේ පසුව සඳහන් වූ තත්ත්වය සමගයි. එය සමාජ සහ දේශපාලන සංයෝජනය තුළ සහ සමාජ ව්‍යුහය තුළ ගැටුමේ ප්‍රභවය සොයයි. මෙහි දී තීරණාත්මක කරුණ වන්නේ සම්බන්ධ වී සිටින පාර්ශවයන්ගේ අවබෝධයෙන් බැහැරව ගැටුම්වලට පැවැතිය හැකි බවයි. ගැටුම්/ සාම පර්යේෂක ෂ්මිඩ් පන්ති ගැටුමක් පිළිබඳ උදාහරණයක් දක්වා යි. එය, "ගැටුමක් නොවන්නේ පන්තිවලට අසංගත අභිලාෂයන් ඇති බැවිනි. පන්ති එකිනෙකා සමග ගැටෙයි. එකිනෙකට වෛර කරයි... (නමුත් වඩා නිවැරදිව පවසනවා නම්) එය ගැටුමක් වන්නේ සමාජ ව්‍යුහය සැදී ඇති ආකාරය අනුව එක් පන්තියකට නැති වන දේ අනික් පන්තිය ලබා ගන්නා බැවිනි" (ෂ්මිඩ් 1968; පිටු 226).

තත්ත්වය එසේ තිබිය දී විෂයමූලිකත්වය සහ ආත්මමූලකත්වය අතර ඇති ප්‍රභේදය අවසානයේ දී පවසන්නේ විශ්ලේෂණාත්මක අගය පිළිබඳ අල්ප මාත්‍රයකි. විෂයමූලක නිරීක්ෂකයා විසින් සම්බන්ධ වී සිටින පාර්ශවයන්ගේ සංජානනයට පටහැනිව ක්‍රම පද්ධතියක ව්‍යුහය ගැටුම්කාරී හෝ ප්‍රචණ්ඩයයි නම් කිරීමේ දී කරනු ලබන්නේ ආත්මමූලක අර්ථකථනයකි. මෙයට පදනම් වන්නේ පළමු කොටම ගැටුමකට අඩංගු වන්නේ කුමක්ද යන්න ගැන ඔහුගේ හෝ ඇයගේ ආත්මමූලක අගයන් සහ උපමානයන් අනුව සලකනු ලැබීමය. ඒ අනුව විෂයමූලක ප්‍රවේශය අගය විරහිත යයි සැලකිය නොහැකිය. එය එසේ වන්නේ "එය ද සහභාගීවන්නන් පසෙක සිටියදී තෙවැනි පාර්ශවයක ආත්මමූලක තක්සේරුවක් පමණක් පිළිබිඹු කරන බැවිනි" (මිචෙල් 1991).

දිගු කල් පවතින ජනවර්ගී-ජාතික ගැටුම්වල පවතින යථාර්ථයන් සලකා බැලීමේදී ප්‍රත්‍යක්ෂ වන දෙයක් නම් මේවා වඩාත් හොඳින් විස්තර වන්නේ ගතික ක්‍රියාවලි ලෙස බවයි. මෙයට ආත්මමූලක ලක්ෂණ මිශ්‍රණයක් (ඒවා නම් අනන්‍යතා, අවශ්‍යතා සහ අපේක්ෂායි). එමෙන්ම විෂයමූලක ව්‍යුහාත්මක යයි සැලකුණු කරුණු ද (ඒවා නම් සම්පත් අසමාන ආකාරයෙන් බෙදීමයි) ද සම්බන්ධ වෙයි. ඒ නිසාවෙන් ආත්ම මූලක හෝ විෂය මූලක වශයෙන් වූ කවර හෝ පාදක ව්‍යුහයක් කෙරෙහි පමණක් විශ්වාසය තැබීම ගැටුමේ සියුම් වෙනස්කම් ග්‍රහණය කර ගැනීමට ප්‍රමාණවත් නොවනු ඇත. ගැටුම් කළමනාකරණය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ගත් කල, සමහර ගැටුම් කළමනාකරණ ප්‍රවේශයන්හි දී ප්‍රකට නොව අප්‍රකට අයුරින් ආත්මමූලකත්වය සහ විෂයමූලකත්වය අතර තිබෙන්නා වූ න්‍යායාත්මක පරතරය සාර්ථක අන්දමින් යා කළ හැකි බැව් නිසැක ව ප්‍රකාශ කළ හැකිය. මෙය සාක්ෂාත් කරගනු ලබන්නේ විවිධ වූ ගැටුම් කළමනාකරණ ක්‍රමෝපායන් ඒකාබද්ධ කිරීමේ මාර්ගයෙනි; උදාහරණ වශයෙන් ගැටුම් කළමනාකරණ ක්‍රමෝපායයන් වන *බලය පිළිබඳ මැදිහත්වීම්* සහ ගැටුම් නිරාකරණ ක්‍රමෝපායයන්, පහසුකම් සැලසීමෙන් හෝ සංවාද වැඩමුළු පවත්වා ආදර්ශයක් වශයෙන් ඉදිරිපත් කළ හැකිය. මෙම ඒකාබද්ධ ක්‍රමවල ගුණාත්මක සහ ප්‍රමාණාත්මක ස්වභාවය ඒවායේ යොදාගනු ලබන ගැටුම් අවස්ථා මත රඳා පවතී.

2.2 තුන්වන පාර්ශවයේ ගතිලක්ෂණ

ගැටුමේ මූලාශ්‍ර සහ ස්වභාවය පිළිබඳව නැවත නැවත කෙරෙන සංවාදයට සමගාමීව තුන්වන පාර්ශවයන්ගේ ගතිලක්ෂණ පිළිබඳව න්‍යායාචාරීන් හා වෘත්තිකයන් අතරේ ඉතා පුළුල් සාකච්ඡා පැවතුණි. මෙය විශේෂයෙන්ම අදාළ වන්නේ ඔහුගේ හෝ ඇයගේ අපක්ෂපාතීත්වය සහ මධ්‍යස්ථ බව යන කාරණය ගැනයි. අතීතයේ දී සාර්ථක යයි සලකනු ලබන තුන්වන පාර්ශවයේ මැදිහත් වීමෙන් ලැබෙන ප්‍රතිඵල කෙතරම් දුරට අපක්ෂපාතීත්වය සහ මධ්‍යස්ථ බව ලබාගන්නේ ද එමෙන්ම විස්තර කරන්නේද යන ප්‍රශ්න පිළිබඳව විද්වත්හු හා වෘත්තිකයෝ සමාන වශයෙන් බෙදී සිටියහ (මෙම අත්පොතේ වෙබ් ජාල සංස්කරණයේ රොන් ෆිෂර්ගේ දායකත්වය බලන්න).

ගෝලීය වශයෙන් පවතින බොහෝ රාජ්‍ය අභ්‍යන්තර ගැටුම්වල ස්වභාවය ගත් කල පක්ෂපාති නොවීම සහ පක්ෂපාතීවීම පිළිබඳ මතය තුන්වන පාර්ශවයන්ගේ අන්‍යෝන්‍ය වශයෙන් පරස්පර ගතිලක්ෂණයන් හැටියට නොසැලකීම යෝග්‍ය බව පෙනේ. ඒවායේ දෙබිඩි සහගත බව ඌන පූරක බව ගැන අවධානය යොමු කිරීම වඩාත් සුදුසුය.

එක් අතකින් ගත් කල තුන්වන පාර්ශවයන්ගේ අපක්ෂපාතී ස්වභාවය අවශ්‍ය වන්නේ විශේෂයෙන්ම එම පාර්ශවයන්ට ආරාවුලක් සම්බන්ධව සාර්ථක ප්‍රතිඵලයක් කරා ළඟාවීමට අවශ්‍ය පෙළඹවීම් ශක්තිය නොමැති වූ විටය. පැහැදිලි උදාහරණයක් වන්නේ ක්වේකරයන්ගේ, පුද්ගලික අයගේ සහ විද්වත් - වෘත්තිකයන්ගේ නිල නොවන මැදිහත්වීමේ ප්‍රයත්නයන්ය. අනික් අතට තුන්වන පාර්ශවයේ පක්ෂපාතිත්වය මූලික විය හැකිවන්නේ මෙම පෙළඹවීම් ශක්තිය පවතින විටය (ක්ලෙයිබෝර්අර් 1996, පිටු 372). මෙහි දී බොහෝ මැද පෙරදිග සාම සාකච්ඡාවල තුන්වන පාර්ශ්වය හැටියට කටයුතු කරන සුපිරි බලවතා වූ අමෙරිකා එක්සත් ජනපදයේ භූමිකාව ක්ෂණයකින් මතකයට එයි.

කෙසේ වුවද, ගැටුම් කළමනාකරණ ක්‍රියාපටිපාටි සංවර්ධනය කිරීම ස්ථිතික හෝ අනම්‍ය සේ නොසැලකිය යුතුය. ඇත්ත වශයෙන් ම එය වෙනස් වන ආකෘතික තත්ත්වයන්ට පහසුවෙන් උපයෝජනය කරගත යුතු ගතික ලක්ෂණවලින් යුත් කාර්යයක් සේ සැලකිය යුතුය. මෙම විශ්ලේෂණය පෙන්වා දෙන පරිදි, එක් අතකින් පහසුකම් සැලසීම හෝ සමාදානය ඇති කිරීම වැනි විවිධ ආකාරයේ ගැටුම් මැදිහත්වීම් ක්‍රම ඵලදායී අන්දමින් සන්දර්භගත කළ යුතු අතර, අනික් අතට ඇත්තේ බලය හා බැඳුණු මැදිහත් වීමයි. මෙය වඩාත් වැදගත් සහ අභියෝගාත්මක වන්නේ දුර්දාන්ත සහ ගැඹුරින් මුල් බැසගත් ගැටුම්වල පථ I, II සහ III ක්‍රියාකාරීන්ගේ බහු ආංශික සහ විවිධාකාර සම්බන්ධවීම් සලකා බලන විටය. ඊළඟ ඡේදයෙන් මෙම ක්‍රියාකාරකම්වලට අවධානය යොමු කෙරේ.

2.3 තුන්වන පාර්ශ්ව මූලෝපායයන්

පථ I, පථ II සහ නවතම එකතුව වන පථ III යන යෙදුම්වලින් (1 වන කොටුවේ පැහැදිලි කර ඇත) භාෂිතයන්ගෙන් අප අදහස් කරන්නේ කුමක්ද? අතීතයේදී මූලික වශයෙන් අවධානය යොමු වූයේ පථ I හි ගැටුම් සමථකරණ මූලෝපායයන් සහ පථ II හි ගැටුම් නිරාකරණ මූලෝපායයන් අතර හරය සහ අවධාරණය සම්බන්ධයෙන් ඇති වෙනස්කම් ගැනයි. පථ I ප්‍රධාන වශයෙන් වෙන් වී තිබුණේ රාජ්‍ය තාන්ත්‍රික සහ ආණ්ඩුවේ ක්‍රියාකාරීන්ගේ නිල සහ විධිමත් ක්‍රියාකාරකම්වලට වන අතර, පථ II වැඩි වශයෙන් යොමු කරන ලද්දේ අනෙකුත් රාජ්‍ය නොවන පාර්ශවයන්ගේ අවිධිමත් සහ නිල නොවන ප්‍රයත්නයන් වෙතය.

පථ I හි ක්‍රියාකාරකම් නිල සහ බලපෑම් රහිත කාර්යයන් වන හිතකාමී සේවා, තොරතුරු ගවේෂණ මෙහෙවර, පහසුකම් සැපයීම, සාකච්ඡා කිරීම/ මැදිහත්වීම සහ සාම සාධනය ආදියෙහි සිට වඩාත් බලපෑම්වලින් යුත් කාර්යයන් වන බලාත්මක-මැදිහත්වීම, බාධක පැනවීම, සාමය බලගැන්වීම සහ බේරුම් කිරීම දක්වා විහිදී යයි (මෙම වෙළුමේ වෙබ් ජාලයේ සංස්කරණය කරන ලද වෙනස්වන සාම සාධනයේ ස්වභාවය ගැන හොඳ සාකච්ඡාවක් සඳහා රොන් ෆිෂර්ගේ ලිපිය සහ හැන්සෙන්, රම්ස්බොතම් සහ වුඩ්හවුස්ගේ ලිපි ද බලන්න).

පථ I ට වඩා හාත්පසින්ම වෙනස් වූ පථ II හි සියලු නිල නොවන සහ බලපෑම් රහිත ක්‍රියාකාරකම් ගැන පහසුකම් සැලසීම සහ උපදෙස් දීම ආදියෙන් තවදුරටත් පැහැදිලි කෙරෙමින් සඳහන් කෙරෙයි (ඇතැම්විට පහසුකම් සැලසීම හෝ උපදෙස් දීම ගැන සඳහන් කිරීමේ දී වඩාත් පොදු යෙදුමක් වන මැදිහත්වීම යන පදය ද හමුවේ). සාමාන්‍යයෙන් මේවා පවත්වනු ලබන්නේ ගැටලු විසඳීමේ වැඩමුළු හෝ වටමේස සාකච්ඡා ආකාරයෙනි.

පථ I සහ පථ II අතර ඇති මෙම විශේෂත්වය තවදුරටත් හඟවන්නේ යොදාගනු ලබන ක්‍රමෝපායයන්හි පැහැදිලි වෙනස්කම් තිබිය හැකි බවයි. අවධාරණය අතින් ගත් කල ක්‍රමෝපායයන් අතර වෙනස්කම් තිබෙන්නට හැකි නමුත් පැහැදිලි කරුණක් වන්නේ බොහෝ තුන්වන පාර්ශව මැදිහත්වීම්වලදී පථ I සහ පථ II ක්‍රමෝපායයන් බොහෝ අවස්ථාවලදී එකිනෙකාට සම්බන්ධ වී හෝ සමහරවිට උවමනාවෙන් ම සම්බන්ධ කොට පැවතීමයි. ප්‍රායෝගික වශයෙන් පථ I ක්‍රියාකාරිකයින් විසින් කරනු ලබන මැදිහත්වීම වැනි ගැටුම් සමථකරණ කටයුතු ඇත්ත වශයෙන්ම ගැටුම් නිරාකරණ

ක්‍රමෝපායයන් පථ II හි ක්‍රියාකාරිකයන් විසින් කරනු ලබන පහසුකම් සැලසීම/ උපදෙස් දීම තුළ පිළිබිඹු විය හැකිය. තීරණාත්මක කරුණ වන්නේ පථ දෙකෙහිම අඩංගු සමහර ලක්ෂණ එකිනෙක ඌණපූරණය කරනු පමණක් නොව න්‍යායය හා අභ්‍යාසය යන දෙයාකාරයෙන්ම සංකලනය වී පැවතීමයි. මෙයට හොඳ උදාහරණයක් නම් 1990 දශකය ආරම්භයේ දී උතුරු අයර්ලන්තයේ දී දරන ලද ගැටුම් කළමනාකරණ ප්‍රයත්නයයි: උතුරු අයර්ලන්තය භාර බ්‍රිතාන්‍ය රාජ්‍ය ලේකම්ගේ පථ I මත පදනම් වූ ගැටුම් සමථ ප්‍රයත්නයන් කෙතරම් දුරට ප්‍රජා සම්බන්ධතා කවුන්සිලයේ පථ II පදනම් කරගත් ගැටුම් නිරාකරණ ප්‍රයත්න සමග සංකලනය වී පවතීදැයි ඩේවිඩ් බ්ලූම්ෆීල්ඩ් (1997) පැහැදිලි කර තිබේ.

ගැටුම් නිරාකරණය සඳහා පූර්ව කොන්දේසියක් ලෙස ගැටුම් සමථය සැලකිය යුතු නොවේ. අත්දැකීම් මත පදනම් වූ උදාහරණයක් වශයෙන් පථ I පදනම් කරගෙන කරනු ලබන සාකච්ඡා අවුල් සහගත ඇණහිටින තත්ත්වයකට පත්වුවහොත්, පහසුකම් සැලසීමේ සහ ගැටලු විසඳීමේ වැඩමුළු (පථ II) ස්වරූපය ගත්, නිල නොවන සහ අවිධිමත් සාකච්ඡා ආරම්භ කොට, පවත්වා ගෙන යාම පමණක් නොව ඉදිරියට යාම සඳහා මඟක් ඇති කර ගැනීමට ද ප්‍රයෝජනවත් වනු ඇත.

1993 වසරේදී ඊශ්‍රායල් රජය හා පලස්තීන විමුක්ති සංවිධානය අතර, ගැටුම් සමථකරණ ආකෘතියකින් ඇරඹී පසුව සාකච්ඡා තුළින් එකඟත්වයකට පැමිණීම සඳහා නෝර්වේ රාජ්‍යය පසු-නාලිකා ක්‍රියාමාර්ගයක් අනුගමනය කරමින් ගෙන ගිය ගැටුම් නිරාකරණ ක්‍රියාවලිය මඟින් මෙය පැහැදිලි කළ හැකිය (ලෙඩරාඩ් 1997, පිටු 32-34 සහ කෝර්බින් 1992 බලන්න). මෙම ක්‍රියාවලියේ දී නෝර්වීජියානු විද්වතෙක් සහ ඔහුගේ භාර්යාව ඊශ්‍රායල් සහ පලස්තීන නිලධාරීන් අතර 1992 දී සිදුවූ මෙම රහස් සාකච්ඡාවට සත්කාර පාර්ශවය වෙමින් පහසුකම් සැලසූහ. සෑම පාර්ශවයකට ම ඉහළ තලයේ අය හා සම්බන්ධවීමටත් ඔවුන්ගේ ස්වාධීනත්වය පවත්වා ගැනීමටත් ඉඩකඩ තිබුණි. නිල සාකච්ඡා නියත වශයෙන් ආරම්භ කිරීමට පෙරාතුව ප්‍රතිවිරුද්ධ පාර්ශව දෙක අතරේ සැහෙන ප්‍රමාණයක සහයෝගතා සම්බන්ධතාවක් අත්පත් කර ගැනීම සාකච්ඡා ක්‍රියාවලියේ ම සාර්ථකත්වයට තීරණාත්මක ලෙස බලපෑ බව ඔප්පු වූවා පමණක් නොව පැහැදිලිවම පෙනී ගිය දෙයක් වූයේ හුදෙකලාව උත්සාහ කිරීමේ දී බලාත්මක මැදිහත්වීම, කේවෙල් කිරීම වැනි ගැටුම් බේරුම් කරන මූලෝපායයන්ගේ සීමිත හැකියාවන්ය. මෙම විශ්ලේෂණය පිටුපස සැඟවී තිබෙන්නා වූ පාදක උපකල්පනය නම් පථ I හෝ පථ II ආකෘතිය මත පූර්ණ විශ්වාසය තැබීමෙන් සම්පූර්ණයෙන් ප්‍රතිඵලදායක වන්නේ ගැටුම් කළමනාකරණ මූලෝපායන්ගෙන් සුළු ප්‍රමාණයක් පමණක් බවයි.

1990 දශකයේ මුල් භාගයේ සිට අන්තර්-සම්බන්ධතාව සහ අන්තර්-පරායත්තතාව කෙරෙහි රඳා පැවැත්ම පිළිබඳ යෝග්‍ය වූ විශ්ලේෂණාත්මක යොමුවක් මතු වී තිබේ. එය දැන් මෙම ක්ෂේත්‍රයේ මධ්‍යගත මතය වී ඇත. 1990 දශකයේ මැද භාගය වන විට ගැටුම් කළමනාකරණයට සමෝධානමය සහ ඌණ පූරක ප්‍රවේශයක් අවධාරණය කරන සාහිත්‍යයේ විස්ථාපනයක් දැක ගන්නට හැකි වී තිබේ. එය තවදුරටත් ප්‍රබල ලෙස අවධාරණය කරන්නේ මැදිහත්වීම සහ සාකච්ඡා කිරීම් වැනි ගැටුම් සමථන ක්‍රමෝපායයන් පහසුකම් සැපයුම/ ගිවිසුම් වැනි ගැටුම් නිරාකරණ ක්‍රමෝපායයන් සමග බද්ධ කිරීමේ අවශ්‍යතාවයි (මේ පිළිබඳ හොඳ උදාහරණ කිහිපයක් ග්ලසල් 1982, ෆිෂර් සහ කීෂ්ලි 1991, ප්‍රෙයින් 1994 යන අයගේ ලේඛනවල අඩංගුවේ).

මෙම සමෝධානමය සහ ඌන පූරණමය ප්‍රවේශයන් පථ I සහ පථ II හි එන ක්‍රමෝපායයන් අතර තිබෙන ද්විභේදනය පිළිබඳව වෙනස්කම් හෙළි කරනු පමණක් නොව නූතන ප්‍රචණ්ඩ ගැටුම් අවස්ථා සහ සාමය ගොඩනැංවීමේ ක්‍රියාකාරකම් ආශ්‍රිත විවිධ සංකීර්ණතාවන් පිළිබඳව හුරුවක් සහ නව අන්තර්ඥානයක් සපයයි. විවිධ ක්‍රියාකාරීන් සහ ගැටුම් කළමනාකරණ ක්‍රියාකාරකම් හා ක්‍රමෝපායයන් සමග වඩාත් සවිඥානක සංයෝජනයක් ඇති කිරීම තීරණාත්මක වෙයි. මේවා ගැටුම් ඇවිලයාම හා සංසිඳීයාම වැනි අදියර හා බැඳුණු දේශපාලන සහ සමාජ ප්‍රමුඛතා සමග මනාව ගැලපිය යුතු වේ.

ෆිෂර් සහ කීෂ්ලි (1991) විසින් ඉදිරිපත් කර ඇති ඉතාමත් ජනප්‍රිය සහ මහත් සේ සාකච්ඡාවට භාජනය වී ඇති "අවිනිශ්චිත තත්ත්වානුරූප ආදර්ශය" (Contingency model) අනුව ගැටුම උත්සන්න වීම වර්ධනය වන විට ඵලදායී වීම සඳහා මැදිහත්වීම ද වඩාත් නිලබල සහගත විය යුතු වේ. මෙම ආකෘතිවලින් ගම්‍ය වන කරුණු දෙකක් ඇතඃ පළමුවැන්න නම් සාමය ගොඩනැංවීමේ සමහර ක්‍රියාකාරකම් සමහර අවස්ථාවල දී අනිකුත් අවස්ථාවලට වඩා තීරණාත්මක විය හැකිය; දෙවැන්න නම් සාමය ගොඩනැංවීමේ සිය ක්‍රියාකාරකම්වල ප්‍රගතිය මැන බලන අවස්ථාවේ දී ක්‍රියාකාරීන් ගැටුම් කළමනාකරණ ක්‍රමෝපායයන්වල පූර්ව අවධියකට පැමිණීම අවශ්‍ය විය හැකිය. අවිනිශ්චිත තත්ත්වානුරූප විවිධ ආදර්ශ පිළිබඳව ගැඹුරින් සාකච්ඡා කිරීම මෙන්ම පාර්ශවයන් අතර සමරූපතාව පිළිබඳ පොදු උපකල්පන හෝ ගැටුම් උත්සන්නවීමේ දෘඩ කාලානුක්‍රම අදියර පිළිබඳ විවේචන සමාලෝචනයට භාජනය කිරීම මෙම ලිපියේ විෂය පථය ඉක්මවා යාමකි (වඩාත් ගැඹුරු සාකච්ඡාවක් සඳහා වෙබ්, කොච්ට්‍රාකොච් සහ වෝල්ටර්ස් 1996, පිටු 171-189).

මෙම ඌණ-පූරක සහ සමෝධානමය ප්‍රවේශයන් ආශ්‍රයෙන් නැගිය යුතු ප්‍රධාන කරුණ වන්නේ සංකීර්ණ වූ ගැටුම් අපේක්ෂා සහ අවශ්‍යතා සැලකිල්ලට ගෙන විවිධ ආකෘති සහ සංකල්පවල සංශ්ලේෂණය මගින් විශ්ලේෂණයට ඉමහත් අගයක් සහ අන්තර්ඥානයක් ළඟා කරගත හැකි වීමයි. ඇත්ත වශයෙන්ම සමහර විද්වත්හු/ ක්‍රියාකාරීහු වැඩිපුර පථ පිළිබඳ සංකල්පයක් හඳුන්වා දෙමින් ඌන පූරණ සහ සමෝධානමය ප්‍රවේශ තවත් පියවරක් ඉදිරියට ගෙන ආහ. මෙයට දැන් පටබැඳී ඇති නාමය වන්නේ, 'බහු පථක ප්‍රවේශය' යන්නයි. ඉතා මෑතදී ඇති වූ සංකල්පය නම් අතිරේක විශේෂිත පථයක් වන පථ III නිර්මාණය කිරීමයි. මෙය යොදාගනු ලබන්නේ පොදු ජනයා පුහුණු කිරීම, ධාරිතා ගොඩනැංවීම සහ බලගැන්වීම, මානසික කම්පන කටයුතු, මානව හිමිකම් සහ සංවර්ධන කටයුතු සහ මානුෂවාදී ආධාර ආදියෙහි නියැළී සිටින ක්‍රියාකාරීන් විසින් ක්‍රියාත්මක කිරීමට භාර ගෙන ඇති සියලු ක්‍රියාවලි සහ ව්‍යුහාත්මක නැඹුරුවක් ගත් ආරම්භක පියවරවල් හඳුන්වා දීමටයි (මෙම වෙළුමේ එන ගුන්තර් බයෙච්ලර්ගේ ලිපිය රජයේ ප්‍රතිසංස්කරණ වැනි ව්‍යුහාත්මක නැඹුරුවක් ගත් ආරම්භක පියවර ගැන විශේෂ ආකාරයේ ප්‍රතිවේධාත්මක සාකච්ඡාවක් ඉදිරිපත් කරයි). අතීතයේදී පථ I සහ II අතර ඇති සරල වෙනස පථ III ට ආවේණික වූ සාමය ගොඩනැංවීමේ ක්‍රියාකාරකම් සහ ප්‍රයත්නයන්ගේ හරවත් බව ප්‍රමාණවත් අන්දමින් හසුකර ගැනීමට අපොහොසත් වූ හෙයින් මෙම ද්විභේදයට ගෝචර නොවූ සියලු දේ ඉවත් කරන ලදී.

කොටුව 1 : පථ I, II සහ පථ III ක්‍රියාකාරීන් සහ ඔවුන්ගේ මූලෝපාය

	පථ - I	පථ - II	පථ - III
සහභාගීවන	දේශපාලන සහ මිලිටරි නායකයන් මැදහත්කරුවන් ලෙස සහ / හෝ ගැටුම් පාර්ශවයන්ගේ නියෝජිතයන් ලෙස	හුදු පුද්ගලයන්, විද්වතුන්, සිවිල් සමථකරණය, ප්‍රජාවේ උපායශීලීත්වය ආදියේ සිට ගැටුම් නිරාකරණයෙන් නියැලී සිටින ජාත්‍යන්තර සහ දේශීය රාජ්‍ය නොවන සංවිධාන දක්වා	පොදු ජනයා පදනම් කරගත් දේශීය සංවිධාන සිට ජාත්‍යන්තර සංවර්ධන නියෝජ්‍යායතන, මානව හිමිකම් සංවිධාන සහ මානුෂවාදී සහයෝගය දක්වා
භාවිත	**ප්‍රතිඵල නැඹුරු:** සම්බාධක, බේරුම් කිරීම, බල මැදිහත්වීම වැනි නිල සහ ප්‍රරෝධක ක්‍රියාමාර්ගවල සිට පහසුකම් සැලසීම, සාකච්ඡා කිරීම, මැදිහත්වීම, තොරතුරු ගවේෂණ මෙහෙවර සහ හිතකර නිල සේවා දක්වා	**ක්‍රියාවලි නැඹුරු:** නිල නොවන සහ ප්‍රරෝධක නොවන ක්‍රියාමාර්ග, ප්‍රධාන වශයෙන් පහසුකම් සැලසීම, ප්‍රශ්න විසඳීමේ වැඩමුළු සහ වටමේස සාකච්ඡා උපදේශන සේවා ස්වරූපයෙන්	**ක්‍රියාවලි සහ / හෝ ව්‍යුහාත්මකව නැඹුරු:** ධාරිතා ගොඩනැංවීම, මානසික කම්පන සමග කටයුතු, පොදු ජන පුහුණු කටයුතු, සංවර්ධන සහ මානව හිමිකම් කටයුතු

3. ගැටුම් කළමනාකරණයට ප්‍රවේශ

ඉහත සඳහන් විශ්ලේෂණාත්මක පසුබිමේ සන්දර්භය අනුව මෙම කොටස ගැටුම් කළමනාකරණය සහ සම්බන්ධව විශේෂයෙන් කැපී පෙනෙන, එහෙත් එකිනෙකට සම්බන්ධ ප්‍රවේශ තුනක් පිළිබඳ පරික්ෂණයකට අවස්ථාව සලසා දෙයි: ගැටුම් සමථය, ගැටුම් නිරාකරණය සහ ගැටුම් ව්‍යාවර්තනය එම ප්‍රවේශ තුනයි. මෙම ප්‍රවේශ තුන හරියාකාරව තේරුම් ගැනීමට නම් ඒවා පැහැදිලි, තනි සහ සර්ව-සම්පූර්ණ න්‍යායාත්මක ක්‍රම හැටියට නිරීක්ෂණය නොකළ යුතු බව අවබෝධ කර ගැනීම තීරණාත්මක වන්නේය. මෙම ප්‍රවේශ තුනම බහු විෂයාත්මක සහ භින්නගතික ලක්ෂණ මත රැඳී තිබියදී එවැනි හුදෙකලා ක්‍රම සාක්ෂාත් කර ගැනීමට හැකිවේ ද යන්නවත් සැක සහිත වේ. ඇත්ත වශයෙන්ම ඒවා ඵලදායී ලෙස තේරුම් ගත හැක්කේ වෙබර්ගේ "පරමාදර්ශී ආකෘතියේ" විපරීත ස්වරූපයක් ලෙසයි. මෙම විශ්ලේෂණයට කිසියම් හැඩයක් ගෙනදීම සඳහා මෙම කොටස පහත සඳහන් කරුණු විවිධාකාරයෙන් අවබෝධ කරගෙන ඇති ආකාරය පිළිබඳව යොමුවනු ඇත. එම කරුණු වන්නේ:

- පාදක න්‍යාය;
- දිග්ගැසුණු ප්‍රචණ්ඩ ගැටුමේ හා හරාත්මක සංකල්පයන්හි ප්‍රභවය;
- ගැටුම;
- සම්බන්ධ වී සිටින ක්‍රියාකාරීන්;

- භාවිත මූලෝපායයන්;
- සාර්ථක ප්‍රතිඵල සඳහා නිර්ණායක සහ සාමයේ ස්වභාවය

න්‍යායය පිළිබඳව කෙරෙන සාකච්ඡාව මතු කරන්නේ ප්‍රවේශ තුනට පාදක වී ඇති, ගම්‍යමාන න්‍යායාත්මක උපකල්පනය. ඒ එකිනෙකක් දිග්ගැසුනා වූ ප්‍රචණ්ඩ ගැටුම්වල ප්‍රභවය විශ්ලේෂණය කිරීම සඳහා එකිනෙකා උත්සාහ කරන අවස්ථාවේ දී ගැටුමට හේතු වන්නා වූ මූලික හේතු කාරක පිළිබඳව එකිනෙකට වෙනස් අවබෝධතා ඉදිරිපත් කරනු ඇත.

තරමක් ගැටලු සහිත වූ මෙම ආත්මමූලක/ විෂයමූලක ද්විභින්නතාව මඟ හැරීමට උත්සාහ ගනු ලබන මෙම කාරණය සඳහා විශ්ලේෂණාත්මක ප්‍රවේශයක් යෝජනා කිරීමේ දී පැහැදිලි, එහෙත් අවශ්‍යයෙන්ම සුවිශේෂ නො වූ අවබෝධතා තුනක් ප්‍රයෝජනවත් වේ:

- දේශපාලන රටාවේ/ පවතින තත්ත්වයේ ගැටලුවක් වශයෙන්
- සමාජ වෙනස්වීම සඳහා උත්ප්‍රේරකයක් වශයෙන්
- සමාජ යුක්තිය සඳහා අවිහිංසා නොවන අරගලයක් වශයෙන්

ගැටුම පිළිබඳ මෙම තුන් ආකාර වූ අවබෝධතා ආභාසය ලබන්නේ වෙබර් (1948) ඩැරෙන්ඩෝෆ් (1957) සහ 1994) කෝසර් (1956) සහ සිම්මෙල් (1955) යන අය විසින් ගැටුම් න්‍යායයන් පිළිබඳ සාපේක්ෂව ගැඹුරින් අධ්‍යයනය කොට ඉදිරිපත් කරන ලද සමාජ න්‍යායයන් තුළිනි. මෙයට වැඩිදුරටත් උත්තේජනයක් ලබාදී ඇත්තේ 'විචාර න්‍යාය' වටා මූලික වශයෙන් භ්‍රමණය වන සමාජ න්‍යාය පිළිබඳ වර්තමාන සංවාද (උදාහරණයක් වශයෙන් පෙදර්ස්ටෝන් සහ පාර්කින් 1997, පෙදර්ස්ටෝන් 2000 බලන්න) සහ ඇන්තනී ගිඩන්ස්ගේ සංස්ථිති න්‍යාය තුළිනි (උදාහරණයක් වශයෙන් ජබ්රි 1996 බලන්න).

මෙහි එන විශ්ලේෂණය මගින් පැහැදිලි කිරීමට බලාපොරොත්තු වන පරිදි, ප්‍රධාන ප්‍රශ්නය හැටියට පෙනී යන්නේ විවිධ ගැටුම් කළමනාකරණ ප්‍රවේශ ක්‍රියාවට නැගෙන්නේ කුමන විශේෂිත වූ ගැටුම් අවබෝධතාවක් යටතේද යන්නයි. පාදක වූ උපකල්පනය වන්නේ ගැටුම පිළිබඳ ඕනෑම විශේෂිත වූ අවබෝධ කර ගැනීමක් හේතු කොට ගෙන ඍජු හා වක්‍ර යන දෙයාකාරයෙන්ම ගැටුම් කළමනාකරණ විද්වතුන්ගේ මතවාදය ද ඇතුළත් පසු, විපාක අවශ්‍යයෙන්ම ස්වයං අවබෝධය කෙරෙහි බලපාන බවයි. මූලික වශයෙන් දේශපාලන රටාවේ ගැටලුවක් වශයෙන් ගැටුම අවබෝධ කර ගැනීම බොහෝ විට ගතානුගතික ස්ථිති සංරක්ෂණ නැඹුරුවක් ඇති සහ ඉතා සුබවාදීව සලකා බලතොත් ගැටුම් කළමනාකරණය සඳහා ප්‍රතිකාරක ප්‍රවේශයක් වශයෙන් පවතී. එයට ප්‍රතිපක්ෂ ව, ගැටුම සමාජ පරිවර්තනයකට උත්ප්‍රේරණයක් වශයෙන් හෝ සමාජ යුක්තිය සඳහා වන අවිහිංසක අරගලයක් වශයෙන් හෝ සලකනු ලබන ගැටුම් කළමනාකරණ ප්‍රවේශ තුළ වඩා රැඩිකල් වූ ව්‍යාවර්තනයකට නැඹුරුවූ ප්‍රවේශයක් අඩංගු වේ.

එක් ප්‍රවේශයක් අනික් ප්‍රවේශයනට වඩා අවශ්‍යයෙන්ම උචිතයැයි මෙයින් ගම්‍ය නොවන අතර, ඇත්තෙන් ම ගැටුම් පිළිබඳ අවබෝධතා තුනම ඒවාට ආවේණික වූ කොන්දේසි මත ගැටුම් කළමනාකරණ ප්‍රයත්න ලෙස කිසියම් ප්‍රයෝජනවත් ඉලක්ක තබාගනී. එසේ වුවද, මා තවදුරටත් තර්ක කරන්නේ අප විසින් ඕනෑම ස්වරූපයක් ගත් ව්‍යාවර්තනීය වූ තිරසාර සාමය ගොඩනැංවීමේ ක්‍රියාවලියක

යෙදීමට බලාපොරොත්තු වන්නේ නම් මෙම අවබෝධතා තුනම ආතති තත්ත්වයෙන් තබාගත යුතු බවයි. කිසියම් ගැටුම් කළමනාකරණ ප්‍රවේශයක් උදාහරණයක් වශයෙන් විකෘත වූ සම්බන්ධතා වෙනස් කළ යුතු ආකාරය නොසලකා හැර ස්ථිති සංරක්ෂණය සඳහා නැඹුරුවීම හේතු කොට ගෙන පීඩාකාරී සහ අසමාන සමාජ තත්ත්වයන් පහළ වන ආකාරයෙන් පෝෂණය කිරීමේ අනතුරුදායක තත්ත්වයකට පත්වන්නට ඉඩ තිබේ (ක්ලෙමන්ට්ස් 1998 පිටු 138 බලන්න). අනික් අතට යම් ප්‍රවේශයක් කිසියම් සමාජයක් තුළ රැඩිකල් ව්‍යාවර්තනයක් පෝෂණය කිරීමේදී එයට සමගාමීව සමාජ රටාව සහ එහි චිරස්ථායී බව දිරිගැන්වීමේ කිසියම් සංවේදීතාවක් පවත්වාගෙන යාම පැහැර හරී නම් එම ප්‍රවේශය අරාජකත්වය කරා යොමු කරන්නක් විය හැකිය.

ක්‍රියාකාරීන් සහ ක්‍රමෝපායයන් පිළිබඳව ලැබී ඇති විශ්ලේෂණය මගින් වෙනස්කම් හඳුනාගනු ලබන්නේ පථ I, II සහ III හි ක්‍රියාකාරීන් සහ ඔවුන්ගේ කැපී පෙනෙන විශේෂිත ලක්ෂණ අතර පමණක් නොව සමාන වූ ක්‍රමෝපායයන් අතර ද බව පෙනෙන්නට තිබේ. එය අතිරේක වශයෙන්, සාර්ථකත්වය පිළිබඳ පාදක අර්ථ නිරූපණ බෙහෙවින් වෙනස් උපකල්පිත ඇගැයුම් නිර්ණායකයන් හඟවන අතරම විවිධ ගැටුම් පිළිගැනීම යුක්ති සහගත වන්නේ කෙබඳු අවස්ථාවලදී ද යන ප්‍රශ්නය ද මතු කරයි.

අවසානයේ ප්‍රවේශ තුන පිළිබඳ විශ්ලේෂණය එතරම් ඍජු තත්ත්වයක් පෙන්නුම් නොකරන ගැටලු සහගත කාර්යයක් බවට පත් වෙයි. මෙම ප්‍රතිඵල අත්වන්නේ මෙම කාරණා පිළිබඳව ඇති කරන්නා වූ උපකල්පන තුළිනි. මෙසේ වන්නේ ක්ෂේත්‍රය තුළ ක්‍රියාත්මක වන බොහෝ විද්වතුන් විසින් මේ ගැටලු පිළිබඳව තමන් භාවිත කරන න්‍යායයන් මත පිහිටා, ප්‍රකට ආකාරයට වඩා ඇඟවීම් අයුරින් ඉදිරිපත් කරනු ලබන උපක්ලපන හේතුවෙනි.

3.1 ගැටුම් සමථය පිළිබඳ ප්‍රත්‍යයකය

ගැටුම් සමථය යනු තිරසාර, සැමට ජය අත්වන විසඳුම් සාක්ෂාත් කර ගැනීම සඳහා භාවිත කෙරෙන ප්‍රතිඵල කෙරෙහි නැඹුරු වූ සහ / හෝ පාදක හේතු පිළිබඳ ව අවශ්‍යයෙන් ම සඳහන් නොකර ඍජු ප්‍රචණ්ඩතා වළක්වන්නා වූ සකලවිධ ක්‍රමෝපායයන් ලෙස හඳුන්වා දිය හැකිය. මෙම ක්‍රියා පටිපාටියට අනුකූලවන නිදර්ශනාත්මක පර්යේෂණ හා සම්බන්ධ උදාහරණ සමහරවිට දැකගත හැකිය. උදාහරණ වශයෙන් හාර්වර්ඩ් විශ්වවිද්‍යාලයේ සාකච්ඡා මාර්ග පිළිබඳ වැඩසටහන හා සම්බන්ධ බර්කෝවිච් (1984 සහ 1996) අයි. විලියම් සාර්ට්මෑන් (1985 සහ 1995) සහ ෆිෂර් සහ යූරි (1981) යන අයගේ කෘති දැක්විය හැකිය.

"කළමනාකරණය පිළිබඳ මතවාදය" පදනම් කරගෙන ගැටුම් සමථය යන අර්ථයෙන් බොහෝ පර්යේෂණ ගැටුම නිර්වචනය කරන්නේ දේශපාලන රටාවේ සහ පවතින තත්ත්වයේ ගැටලුවක් හැටියටය. ඒ අනුව ප්‍රචණ්ඩ මෙන්ම දිග්ගැස්සුනු ගැටුම සලකනු ලබන්නේ අනනුරූප අපේක්ෂා සහ / හෝ දුලබ බල සම්පත්, විශේෂයෙන්ම භූමි ප්‍රදේශ සඳහා වූ තරගකාරීත්වයයි.

එවැනි නිර්වචනයක් ඇත්ත වශයෙන්ම හඟවන්නේ ගැටුම එක් පාර්ශ්වයක් දිනුමක් ලබන විට එය අනෙක් පාර්ශවයට පරාදයක් වන ශූන්‍ය-ඓක්‍ය (zero-sum) ක්‍රීඩාවක් වශයෙන් වන අතර ගැටුම් සමථය සඳහා මෙම චින්තන මාර්ගය අනුගමනය කිරීම අවශ්‍යයෙන්ම කළ යුතු දෙයක් නොවේ.

සම්බන්ධ වී සිටින ක්‍රියාකාරිකයින්ගේ විශේෂිත වූ අපේක්ෂා සහ උත්සන්නවීමේ අවස්ථාව ද අනුව ගැටුම් සමථය ඉතා පහසුවෙන් ශුන්‍ය-ඓක්‍ය ක්‍රීඩාව ඉක්මවා යාමට ඉඩ තිබේ. එය ධන-ඓක්‍ය ප්‍රතිඵලයකට නොවේ නම් ඒ වෙනුවට නිර්ශුන්‍ය ඓක්‍යය ක්‍රීඩාවක් කරා ගෙන යා හැකිය. මෙම කාරණය යථාර්ථවාදී, තර්කාන්විත, ක්‍රියාකාරක ආදර්ශ පිළිබඳ පර්යේෂණවල දී පැහැදිලිවම නිදර්ශන සහිතව ඉදිරිපත් කර ඇති අතර, බර්කෝවිච් සහ සැට්මන් තම කෘති සහ ක්‍රීඩා න්‍යායයට පාදක කරගන්නේ මෙම ආදර්ශයන් ය. ඒවායින් යුරිගේ සහ ෆිෂර්ගේ කෘති ආභාසය ලැබී ඇත (බ්‍රම්ස් 1990 ද බලන්න).

ගැටුම් සමථන අභ්‍යාසයේ දී තර්කානුකූල තෝරාගැනීම සහ ක්‍රීඩා න්‍යාය යන දෙකම යොදාගනු ලබන විට වඩා කැපී පෙනෙන මූලික ක්‍රියාකාරීන් වශයෙන් කටයුතු කරන දේශපාලන සහ මිලිටරි නායකයන් දෙස වැඩි කොටම බලන්නේ තර්කානුකූල ක්‍රියාකාරීන් ලෙසයි. ඔවුන් තමන්ගේ අපේක්ෂා ගණන් බලමින් අවසානයේ දී තර්කානුකූල සහ අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක වන ඉලක්කයක් කරා යාමට සාමූහික ව ක්‍රියා කරනු ඇත. න්‍යායයන් දෙකම එවිට ඉලක්ක කරගන්නේ අවිනිශ්චිත තත්ත්වයන් යටතේ අන්‍යෝන්‍ය ව කටයුතු කරන ක්‍රීඩකයන්ගේ ප්‍රයෝජනය සඳහා උපරිම වාසිදායක ක්‍රමෝපායයක් නිරූපණය කිරීමටය.

මෙම තර්කානුකූල ක්‍රියාකාරක උපකල්පනය මත පදනම් වූ ක්‍රීඩා න්‍යාය ආදර්ශය එවිට පෙන්වා දෙන්නේ අන්‍යෝන්‍ය තෘප්තිය හෝ වෙනස්වීම සඳහා ඇති උපරිම ඉඩකඩ, ආත්මාර්ථකාමී අපේක්ෂා, මමත්වය (යථාර්ථවාදී) හා බැඳුනා වූ බල දේශපාලනයේ ස්වභාවික ප්‍රතිඵල බවයි. වෙනත් අයුරකින් පවසනවා නම්, ගැටුම් සමථය නිර්ශුන්‍ය ඓක්‍ය ප්‍රයෝගයක් හැටියට සංකල්පනය කළ හැකිය. එහිදී එක් පාර්ශවයකට අත්වන වාසිය අවශ්‍යයෙන්ම අනික් පාර්ශවයට පාඩු අත්වන ආකාරයේ වීමක් නොවිය හැකිය. ඒ අනුව චර්යාමය වූ නැඹුරුවක් ඇති තර්කානුසාරී ආදර්ශ පදනම් කරගත් සමෝධානමය සහ විභාජන කේවෙල් කිරීම පැති දෙකේම තීරණ ගන්නා අයට පිරිවැය-ප්‍රතිලාභ ලබාදෙන බව ඔප්පු වනවා ඇත (බෙනට් 1996 පිටු 157-184 බලන්න). සාම්ප්‍රදායික වශයෙන් විභාජන ප්‍රවේශය ශුන්‍ය-ඓක්‍ය කේවෙල් කිරීම සමග සම්බන්ධ වන අතර, සමෝධානමය ප්‍රවේශය සලකන්නේ කේවෙල් කිරීම සාකච්ඡාවට සහභාගීවන හවුල්කරුවන් අතර බෙදාහදා ගැනීම පිළිබඳ ප්‍රශ්නයක් වශයෙනි. ඒ අනුව එ මඟින් නිර්ශුන්‍ය ඓක්‍යයක් හෝ ධන-ඓක්‍ය ප්‍රතිඵලයක් හඳුනා ගැනීමට හා ලබාගැන්මට බලාපොරොත්තු වෙයි.

ගැටුම් සමථන ප්‍රවේශය යටතේ අවශ්‍ය වන තවත් කරුණක් වන්නේ පාර්ශවයන් දෙකම සන්දර්භානුගත තත්ත්වයන් ප්‍රමාණවත් ලෙස පැහැදිලි කර ගැනීමයි. එහිදී තත්ත්වයන් හා අපේක්ෂා අතර වෙනස පිළිබඳව විශේෂයෙන් යොමු විය යුතු වේ: තත්ත්වයන් නිර්වචනය කරන්නේ ඇත්ත වශයෙන්ම, කෙටි කාලීන, පෘෂ්ඨීය ආකල්පයක් වන අතර, අපේක්ෂා පිළිබිඹු කරන්නේ වඩාත් මූලික සහ දීර්ඝකාලීන අභිප්‍රායයන්ය. සාකච්ඡාවල දී සෑම පාර්ශවයක් තුළම මෙම අභිප්‍රායයන් ඇත.

ගැටුම් සමථකරණ අවස්ථාවන්හි දී තත්ත්වයන් සාමාන්‍යයෙන් සලකනු ලබන්නේ හුවමාරු කරගත නොහැකි දේ වශයෙන් වන අතර, එක් එක් පාර්ශවයේ අපේක්ෂා එකිනෙක අතර ගැලපෙන සේ ඉඩකඩ සපයාදීමේ වඩාත් හැකියාවක් ඇත. තමන්ගේ අව්‍යාජ අපේක්ෂා අතර ඇති අනුරූපතාවේ

ප්‍රමාණය මගින් එක් එක් පාර්ශවයේ දෘෂ්ටිය සහ සම්බන්ධ බොහෝ මනෝ විද්‍යාත්මක අංග දැඩි ලෙස බලපෑමට ලක් කරනු මෙන්ම තීරණය කරනු ද ඇත.

ගැටුම් සමථකරණ ක්ෂේත්‍රයට අදාළ බොහොමයක් පර්යේෂණ කටයුතු මූලික වශයෙන් ක්‍රියාත්මක වී ඇත්තේ තුන්වන පාර්ශ්වයේ ගතිලක්ෂණ සහ ක්‍රමෝපායයන් පිළිබඳවය. ඒවා ශූන්‍ය-ඓක්‍ය කළමනාකාර ක්‍රියාවලියක් නිර්ශූන්‍ය ඓක්‍ය ගැටුම් කළමනාකරණ ක්‍රියාවලියකට ව්‍යාවර්තනය සඳහා උදව් වෙයි. ඒ අනුව ප්‍රචණ්ඩත්වය අවසන් කිරීමට සහ කිසියම් ආකාරයක දේශපාලන එකඟත්වයක් ලබාගැනීමට හැකියාව ලැබේ.

මෙම ක්ෂේත්‍රයේ ප්‍රධාන ක්‍රියාකාරීන් වන්නේ මිලිටරි, දේශපාලන සහ ආගමික නායකයින් සහ I පථයේ තීරකයන්ය. යොදාගන්නා ලද බොහෝ ක්‍රමෝපායයන් නිල තත්ත්වයේ සිට හිතකාරී සේවා, තොරතුරු සෙවීමේ මෙහෙවර, පහසුකම් සැලසුම, සාකච්ඡා කිරීම සහ මැදිහත්වීම වැනි බලපෑම් රහිත පියවරවල සිට වඩාත් බලපෑම් සහිත ක්‍රියාවලි වන බල මැදිහත්වීම්, තහංචි සහ බේරුම් කිරීම දක්වා විහිදෙයි. ගැටුම් සමථය සඳහා වඩාත් බලපෑම් සහිත ක්‍රමෝපායයන් සාමාන්‍යයෙන් පෙන්නුම් කරන්නේ තුන්වන පාර්ශවයන්ගේ කෙටි කාලීන සහභාගීත්වය තුළ වන අතර, බලපෑම් රහිත පියවර වන පහසුකම් සැලසීම, තොරතුරු සෙවීමේ මෙහෙවර සහ හිතකාරී සේවා කිරීමට භාරගනු ලබන්නේ දීර්ඝ කාලීන දෘෂ්ටිකෝණයක් තුළිනි.

ඍජු ප්‍රචණ්ඩත්වය සහ එහි නිෂේධක සහ විනාශකාරී ප්‍රතිවිපාක කෙරෙහි අවධානය යොමු කිරීම, පැහැදිලිවම ප්‍රතිඵල කෙරෙහි නැඹුරුවීමකි. සටන් විරාමයක් මගින් හෝ එදිරිවාදිකම් නැවැත්වීම මඟින් ප්‍රචණ්ඩ ගැටුම් අවසන් කිරීමට බලාපොරොත්තු වන සියලු ක්‍රමෝපායයන් සමහරවිට බලාපොරොත්තු විය හැකි පරිදි කුමන අයුරකින් හෝ වඩාත් ස්ථිර දේශපාලන එකඟත්වයක් කරා ගෙන යාමට ඉඩ තිබේ. ගැටුම් සමථන ක්‍රමෝපායයන් ඒ අනුව ක්‍රියාත්මක වන්නේ සාර්ථකත්වය සහ සාමය පිළිබඳ සාපේක්ෂ වූ සීමිත සංකල්පයක් තුළිනි: සාර්ථකත්වය නිර්වචනය කර ඇත්තේ සැමට තිරසර ජය ලැබෙන විසඳුමක් වශයෙනි. තවද සාමය දකින්නේ හුදෙක් නිෂේධනාත්මක ලක්ෂණවලින් සමන්විත වූවක් වශයෙනි. දීර්ඝකාලීන ධනාත්මක සාමයක් හෝ සමාජ යුක්තියක් සඳහා වන නිශ්චිත අරමුණක් එහි නොමැත.

3.2 ගැටුම් නිරාකරණ ප්‍රත්‍යයකය

ගැටුම් නිරාකරණය යොමුවන්නේ ඍජු, සංස්කෘතික සහ ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වයට පාදක වූ හේතු ගැන විමසා බැලීමට බලාපොරොත්තු වන ක්‍රියාවලි නැඹුරුවකින් යුත් සියලු ක්‍රියාකාරකම් වෙතය. ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය යන්නෙන් නිර්වචනය වන්නේ සමාන නොවන්නා වූ බලය, ආධිපත්‍යය සහ පරාධීනත්වය දිගින් දිගටම පවත්වාගෙන යන ගැටුම් අවස්ථාවක පවතින සමාජ, දේශපාලන සහ ආර්ථික ව්‍යුහය වන අතර සංස්කෘතික ප්‍රචණ්ඩත්වය යනු ඍජු හා ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වය සමාජ හා සංස්කෘතික වශයෙන් නීත්‍යානුකූලකරණයයි. විද්වත් ශාස්ත්‍රඥයෙකු හා වෘත්තිකයෙකු ලෙස බර්ටන් ගැටුම් නිරාකරණ ප්‍රවේශය පිළිබඳව ඔහුගේ සාර්ථකත්වය පෙන්නුම් කර ඇති බැවින් ඔහුගේ කෘතිය නිදර්ශනාත්මක උදාහරණයක් වශයෙන් සැලකේ. ගැටුම් කළමනාකරණ

ක්ෂේත්‍රයෙහි කටයුතු කරන අනෙකුත් විද්වත්, වෘත්තිකයන් වන්නේ හර්බ් කෙල්මෑන්, රොන් ෆිෂර් සහ ලුවීස් ක්‍රීස්බර්ග් ය.

ශූන්‍ය-ඓක්‍ය ගැටුම් කළමනාකරණ ප්‍රවේශයන්ගේ ස්වයං පැරදුම් ගතිකත්වයන් ජයගැන්ම සඳහා ගැටුම් නිරාකරණ ක්‍රීඩා න්‍යායය උපයෝගී කර ගැනීමට ගැටුම් නිරාකරණය ප්‍රයත්න දරයි. ඒ අනුව, ගැටුම අන්‍යෝන්‍ය වශයෙන් පිළිගත හැකි විසඳුම් සහිත හවුලේ වගකිව යුතු ප්‍රශ්නයක් වශයෙන් නැවත රාමුගත කෙරෙනු ඇත. බර්මන් විසින් ක්‍රීඩා න්‍යායය, සයබර්නතික විද්‍යාව සහ පද්ධති න්‍යායයට සම්බන්ධ ආකෘති පාවිච්චි කර ඇත. උදාහරණයක් වශයෙන්, Systems, States, Diplomacy and Rules කෘතියෙහි, (පද්ධති, රාජ්‍ය, රාජ්‍ය තාන්ත්‍රික මෙහෙයුම් සහ නීති එම ආකෘති ඔහු යොදාගෙන ඇත්තේ රාජ්‍ය අතර සිදුවන බොහෝ ගැටුම් හටගන්නේ විපරීත වූ තීරණ ගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් බව පැහැදිලි කර දීම සඳහාය (බර්ටන් 1968 බලන්න). ගැටුම් සමථකරණ ප්‍රවේශයට හාත්පසින්ම වෙනස් අන්දමට ගැටුම් නිරාකරණය ආරම්භ වන්නේ දිගටම පවතින ගැටුම මානව අවශ්‍යතා සපුරාලීමට නොහැකි වීමේ ස්වභාවික ප්‍රතිඵලය ලෙස නිර්වචනය කරමින්ය. ඒ නිසාවෙන් දිග්ගැස්සුණු ගැටුමේ ප්‍රභවය එයට සහභාගී වන අයගේ යටි අවශ්‍යතා තුළ දැකගත හැකි වේ.

ගැටුම සම්බන්ධයෙන් වූ මෙම අර්ථ නිරූපණය කෙරේ බොහෝ සෙයින් බලපා ඇත්තේ බර්ටන්ගේ 'ලෝක සමාජ ප්‍රවේශය' සහ ඔහුගේ මානව අවශ්‍යතා න්‍යාය පිළිබඳ කෘතියේ ඇතුළත් කරුණුයි. දෙවැන්නේ සඳහන් වන්නේ මූලික සහ සත්භාව විචාරාත්මක අවශ්‍යතා සපුරා ගැනීම සඳහා වන විශ්ව පරිශ්‍රමය ගැනයි. එම අවශ්‍යතා වන්නේ ආරක්ෂාව, අනන්‍යතාව, පිළිගැනීම, ආහාර, නිවාස, සුරක්ෂිතතාව, සහභාගීත්වය, විභාජන යුක්තිය සහ සංවර්ධනය ආදියයි (බර්ටන් 1990 බලන්න). ගැටුම් නිරාකරණය යන්නෙන් ඇතැම් විට බලාපොරොත්තු වන්නේ ගැටුම ඉවත් කිරීමක් ම නොවේ: ඇත්ත වශයෙන්ම පිළිගනු ලබන්නේ ප්‍රචණ්ඩ නොවන ආකාරයෙන් ප්‍රකාශ වන ගැටුම සමාජ වෙනසක් සඳහා අවශ්‍ය උත්ප්‍රේරකයක් විය හැකි බවයි. එවිට ඉලක්කය බවට පත්වන්නේ ගැටුමට සම්බන්ධ පාර්ශවයන්ගේ ඉටු වී නොමැති අවශ්‍යතා සහ බිය සැක දක්වා වූ ආරම්භය තෙක් පිරික්සා ගොස් ගැටුමේ ප්‍රචණ්ඩ සහ විනාශකාරී ලක්ෂණ ඉවත් කිරීමයි. ගැටලුව විසඳීමට අවශ්‍ය යතුර වන්නේ පාර්ශ්වයන්ට මෙම යටපත් වූ අවශ්‍යතා වන අනන්‍යතාව, ආරක්ෂාව සහ සහභාගීත්වය පිළිබඳව අවබෝධයක් ලබාදීමය. ඊට පසුව අපේක්ෂා සහ තත්ත්වයන් යන දෙකම ප්‍රතිනිර්වචනය සඳහා ඒවා පාවිච්චි කළ හැකිය.

සියලු අවශ්‍යතා එක්විටම සපුරාලිය හැක්කේ කෙබඳු තත්ත්වයන් යටතේ ද යන්න බර්ටන් පැහැදිලි කර නොදෙන අතර, ඔහු වෘත්තිකයන්ගෙන් තදින් ඉල්ලා සිටින්නේ අවශ්‍යතා සහ සම්බන්ධතා යන දෙකම වඩාත් හොඳින් පැහැදිලි කරදීම සඳහා විශ්ලේෂණය ගැඹුරු හා පුළුල් අන්දමින් කරන ලෙසයි. මේ ආකාරයේ විශ්ලේෂණයකින් ප්‍රතිවිපාක දෙකක් මතුවෙයි. පළමුවැන්න නම්, ගැටුම පිළිබඳ පුළුල් වූ විශ්ලේෂණයකි. එහිදී අවශ්‍යතා පිළිබඳව අවධාරණය කරමින් ප්‍රතිඵලවලට නැඹුරු වූ සහ සාකච්ඡා කළ හැකි අපේක්ෂාවලට යොමු වූ ගැටුම් සමථකරණ ක්‍රමෝපායයන් අතිශයින් අභිබවා යන ක්‍රමෝපායයන් ඉල්ලා සිටිනු ඇත. මෙම ප්‍රතිඵලය අත්වී තිබෙන්නේ අවශ්‍යතා සහ බිය, අපේක්ෂාවලට ප්‍රතිවිරුද්ධ බැවින් හා සාකච්ඡා කළ නොහැකි බැවින්ය. එහෙත් අනික් අතට එක් එක් පාර්ශවයේ අවශ්‍යතා සහ බිය සැක පිළිබඳව සාමූහිකව ක්‍රියා කිරීමෙන් වැඩි ප්‍රතිඵල ලැබෙන පරිදි කටයුතු කිරීමට

හැකියාව තිබේ. වෙනත් අය අතර බර්ටන් විසින් වඩාත් ක්‍රියාවලිවලට නැඹුරු වූ සහ සම්බන්ධතාවලට නැඹුරු වූ ක්‍රමෝපායයන් යෝජනා කර ඇත. ඒවා බලපෑම්වලින් තොර වූ ප්‍රවේශයන් සහ නිල නොවන (පථ II) ක්‍රියාකාරකම් වන පාලිත සන්නිවේදන, ගැටලු විසඳන වැඩමුළු හෝ වටමේස සාකච්ඡාවල ස්වරූපය ගත් පහසුකම් සැපයුම හෝ උපදෙස් සැපයීම ද යෝජනා කර ඇත. මේ ආකාරයෙන් අනුගමනය කරගෙන යන්නා වූ පහසුකම් සැපයුම සහ උපදෙස් සැපයීම ඍජු සන්නිවේදන සහ ගැඹුරු ගැටුම් විශ්ලේෂණ තුළින් නිර්මාණාත්මකව ප්‍රශ්න විසඳීම පහසු කිරීම සඳහා තුන්වන පාර්ශවයේ සාර්ථක ප්‍රයත්නයක් බවට පත්වෙයි.

දෙවැන්න වන්නේ ගැටුම් විශ්ලේෂණය ගැඹුරුවීම සහ ක්‍රමෝපායයන් පුළුල්වීම හේතු කොට ගෙන ක්‍රියාවලිය සඳහා ක්‍රියාකාරීන් වඩාත් විශාල සංඛ්‍යාවක් සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය වීමයි. මොවුන් සිවිල් සමාජ කණ්ඩායම්, අධ්‍යයන ආයතන සහ පථ II තලයේ ක්‍රියාත්මක වන දේශීය සහ ජාත්‍යන්තර ගැටුම් නිරාකරණ කාර්යයන්හි යෙදී සිටින්නා වූ රාජ්‍ය නොවන සංවිධාන ඇතුළුව සියලු ආකාරයේ සිවිල් මැදිහත්වීම් කණ්ඩායම්, රාජ්‍ය තාන්ත්‍රිකයන්, හෝ ප්‍රජාව තුළ සිටින උපායශීලී පුද්ගලයන් අතුරින් කැඳවාගත හැකිය.

ප්‍රශ්න විසඳීමේ වැඩමුළු මාලාවක් වැනි ක්‍රමෝපායයන් බොහොමයක් මධ්‍යම කාලීන සහභාගීත්වයක ස්වරූපයක් ගන්නා අතර සංවාදයක් පවත්වාගෙන යාමේ සහ වර්ධනය කිරීමේ ක්‍රියාවලිය වඩාත් හොඳින් තේරුම්ගත යුත්තේ කෙටිකාලීන සහභාගීත්වයක් වශයෙනි. ඇත්ත වශයෙන්ම පාර්ශ්වයන් අතර වැඩි දියුණු කරන ලද සහයෝගතාවයකින් සහ වර්ධනය කරන ලද සන්නිවේදනයක මාර්ගයෙන් වඩාත් ගැඹුරු වූ පොදු අපේක්ෂා සහ පොදුවේ පරිහරණය කරනු ලබන අවශ්‍යතා ගැටුම් කළමනාකරණයේ එක්තරා සාර්ථක ප්‍රතිඵලයක් බවට පත්විය හැකිය. බර්ටන්ගේ මානව අවශ්‍යතා ප්‍රවේශය පිළිබඳ මතය අනුව ඕනෑම ආකාරයක සාර්ථක ප්‍රතිඵලයක් පාර්ශවයන් දෙකේම අවශ්‍යතා සපුරාලීමේ අවම අවශ්‍යතා මත පදනම් විය යුතුය.

3.3. ගැටුම් ව්‍යාවර්තන ප්‍රත්‍යයකය

ගැටුම් ව්‍යාවර්තනය ප්‍රතිඵල, ක්‍රියාවලි සහ ව්‍යූහාත්මක නැඹුරුවකින් යුත් දිගුකාලීන සාමය ගොඩනැගීමේ ප්‍රයත්න ගැන සඳහන් කරයි. ඒවායින් බලාපොරොත්තු වන්නේ ප්‍රත්‍යක්ෂ වශයෙන් දිස්වන ඍජු, සංස්කෘතික සහ ව්‍යූහාත්මක ප්‍රචණ්ඩත්වය නියත වශයෙන්ම මැඩ පැවැත්වීමයි. මේ ක්ෂේත්‍රයේ කටයුතු කරන වඩාත්ම කැපී පෙනෙන විද්වත් / වෘත්තික පුද්ගලයන් වන්නේ ලෙඩෙරාච් (1994 සහ 1997), කර්ලි (1971) සහ ගැටුම් / සාම පර්යේෂක ගල්ටුං (1996) යන අයයි.

ගැටුම් ව්‍යාවර්තනය පෙර දැක්වූ ප්‍රවේශයන් දෙකේම අරමුණුවලින් ඔබ්බට ගමන් කරයි. ඒ අතරම, ගැටුම් නිරාකරණයේ අදහස් බොහොමයක් උකහා ගනියි. ඒ අතරින් විශේෂ වන්නේ ජෝන් බර්ටන්ගේ 'ගැටුම් වැළැක්වීම' පිළිබඳ මතයයි. "ගැටුම් වැළැක්වීම යන්නෙන් අදහස් කරනු ලබන්නේ, එහි මානව අංශ ද ඇතුළත් වන පරිදි, ගැටුම් සංසිද්ධිය ගැන ප්‍රමාණවත් විස්තර කිරීමකින් පසු පැමිණෙන නිගමනයයි. තවද, එය ගැටුම් නිර්මාණය කරන පරිසරයක් නිර්මාණය කරන තත්ත්වයක් සහ ඒවා ඉවත් කිරීමට අවශ්‍ය වන ව්‍යූහාත්මක වෙනස්කම්වලට සීමා නොවන අතර, වඩාත් වැදගත් වන්නේ *සහයෝගතා* සම්බන්ධකම් නිර්මාණය කරන තත්ත්වයන් ප්‍රවර්ධනය කිරීමයි (බර්ටන් සහ ඩියුක්, 1990, 2 පිටුව).

මූලික වශයෙන් බර්ටන්ගේ සිත තුළ තිබුණේ තිරස් සම්බන්ධතාවන් ගැනය. එනම්, සාපේක්ෂා වශයෙන් සමාන තරාතිරම්වලට අයත් ක්‍රියාකාරීන් හෙවත් ගැටුමට සම්බන්ධ පාර්ශවයන් අතර, II පථයේ ගැටලු නිරාකරණ වැඩමුළු වැනි සන්දර්භවල මෙන් වන සාකච්ඡා සහ සහයෝගීතාවයන් ය (ලෙඩෙරාච් 1999 බලන්න). අසමාන තරාතිරම්වලින් සමන්විත ක්‍රියාකාරීන් අතර සංවාදය සහ සහයෝගය වර්ධනය කරන්නා වූ සිරස් සම්බන්ධතා තවදුරටත් වර්ධනය කිරීම සහ ගොඩනැගීම සඳහා වන වැදගත් අවස්ථාවක් කෙසේ වුවද ගැටුම් නිරාකරණ ප්‍රවේශයෙන් මගහැරී ගියේය. පථ I සම්බන්ධ තීරකයන් සහ පථ III බිම් මට්ටමේ නායකයන් සම්බන්ධයෙන් බොහෝ විට යථාර්ථය මෙයයි. මෙම අවස්ථාව දැන් ගැටුම් ව්‍යාවර්තන ප්‍රවේශය විසින් භාරගෙන ඇත (එම, පිටු 30-31). විශේෂයෙන්ම ලෙඩෙරාච් ඉදිරිපත් කර ඇති පරිදි ගැටුම් ව්‍යාවර්තනයේ කේන්ද්‍රීය අවධාරණය යොමු වන්නේ මෙම ප්‍රශ්නය කෙරෙහිය. නාභිගත වීම සම්බන්ධයෙන් වූ මෙම විශ්ලේෂණාත්මක සහ ප්‍රායෝගික විස්ථාපනය උපකල්පන කිහිපයක් මත පදනම් වී තිබේ.

පළමුව, බර්ටන්ගේ අවශ්‍යතා සපුරාලීමේ සංකල්පයක් මත ගොඩනැංවීමේදී ඕනෑම සාර්ථක ගැටුම් ව්‍යාවර්තන ක්‍රමෝපායයක් සාමය ගොඩනැගීමේ ක්‍රියාවලියෙහි දී පථ III ක්‍රියාකාරීන් ඇතුළත් කරගත යුත්තේ ඔවුන් ප්‍රචණ්ඩ ගැටුම් හේතු කොට ගෙන ඇතිවන ප්‍රතිවිපාකවලින් වැඩිපුරම පීඩාවට ලක් වූ අය සමග කටයුතු කරන බැවිනි (ලෙඩෙරාච් 1995 සහ 1997 බලන්න). ඔවුන්ගේ මූලික අවශ්‍යතා සපුරාගැනීමට නොහැකිවීම හේතු කොට ගෙන මුල් බැසගෙන තිබූ ප්‍රචණ්ඩත්වය සහ වෛරය මතුකරලීමට මුල පටන්ම ඉඩකඩ සලසයි.

දෙවනුව, ගැටුම් සමථකරණ ප්‍රවේශයේ ප්‍රමුඛ ස්ථානයක් ගත් 'කළමනාකරණ තර්කය' සලකා බලන කල, පථ III ක්‍රියාකාරීන් හා ක්‍රමෝපායයන් ඇතුළත් කර ගැනීම එයට හාත්පසින්ම වෙනස් වූ අත්දැකීමක් වන්නේය. ඇත්ත වශයෙන්ම පථ III ක්‍රමෝපායයන් වන ධාරිතා ගොඩනැගීම සහ බලගැන්වීම සඳහා වන වැඩමුළු පිළිබිඹු කරන්නේ (ප්‍රාදෙශික) බලගැන්වීමේ තර්කයයි' යි. තවද, පථ III හි උඩු අත් ක්‍රමෝපායයන් මගින් බලාපොරොත්තු වන්නේ සමාජ යුක්තිය උදෙසා ප්‍රාදේශීය අරගලවලට සහයෝගය දීම හා සමහරවිට ඒවා ඇති කිරීමය. එනම් රැඩිකල් වූ ව්‍යූහාත්මක වෙනස්වීමක් උදෙසා ක්‍රියා කිරීමය.

පාදක උපකල්පනය වශයෙන් සැලකිය හැක්කේ සාමය ගොඩනැගීමේ විභව ශක්තිය කිසියම් ප්‍රදේශයක් තුළ හෝ ප්‍රජාවක් තුළ තිබෙන්නට හැකි බවය. එය සාම්ප්‍රදායික සංස්කෘතිය තුළ මුල් බැසගෙන ඇත. ඒ අනුව කිසියම් ගැටුම් සන්දර්භයක ක්‍රියාත්මක වන සංස්කෘතික ඥානය හා මූලාශ්‍රයන් ගැන අවබෝධයෙන් තොරව හෝ ස්වල්ප අවබෝධයකින් යුතුව ගැටුම් කළමනාකරණ ශිල්ප ක්‍රම සංස්කෘතිය කෙරේ ආරෝපණය නොකළ හැකිවාක් මෙන් ම ආරෝපණය නොකළ යුත්තේය (ලෙඩරාච් 1995). ප්‍රාදේශීය අරගල මත සාමය ගොඩනැගීම් යනු සමාජය ගැටුමක් හසුරුවන ආකාරය පිළිබඳ පෙර පැවති සාම්ප්‍රදායික ක්‍රම පිළිබඳ දැනුවත්වීමයි. මේ සම්බන්ධ හොඳ උදාහරණයක් හැටියට දැක්විය හැකිවන්නේ සෝමාලියාවේ වැඩිහිටියන් අනුගමනය කරන ක්‍රමයයි. ඔවුන්ට ගෝත්‍රයේ සාමාජිකයින් වශයෙන් ඉදිරිපත් වී තමන්ගේ සම්ප්‍රදායික අධිකාරී බලතල යොදා ගැටුමක් සමථය කොට එකඟත්වය පිළිගැනීම සඳහා ගැටුම් පාර්ශවයන් කෙරෙහි බලපෑම් ඇති කළ හැකිය.

සාමාන්‍යයෙන් පථ III ක්‍රියාකාරකම් හොඳින් ස්ථාපිතව ඇත්තේත් තේරුම්ගත යුත්තේත් ෂාප් (1973), ගාන්ධි (1935 සහ 1950) සහ කිං (1963) ආදීන් විසින් ඉදිරිපත් කර ඇති අවිහිංසා ක්‍රියා මාර්ග පිළිබඳ න්‍යායාත්මක රාමුවේ සන්දර්භය මත පිහිටාය. මෙම ක්‍රියාකාරීන් / විද්වතුන් තිදෙනා කෙරෙහි බලපා ඇත්තේ අතිශයින් වෙනස් වූ ආගමික විශ්වාස සහ දෘෂ්ටිවාද වන නමුත්, ඔවුන් සැම දෙනා පොදුවේ පිළිගත් දෙයක් වූයේ ගැටුම සමාජ යුක්තිය සඳහා වන අරගලයක්ය යන මතයයි. "අවිහිංසා ක්‍රියාමාර්ග මගින් දැනට පවතින එහෙත් යටපත් කර දමා ඇති ක්‍රියා ආතති සහ පරස්පර විරෝධතා මතුපිටට ගෙන එයි" (මැකාර්ති සහ ෂාප් 1997). සැඟවී තිබුණා වූ ගැටුම් මතුපිටට ගෙන ආ හැක්කේ මූලික වශයෙන් ජනතා බලයක ස්වරූපයෙන් සහ 'අර්ථදායී අවිහිංසාමය ආතති' ජනනය කිරීම තුළිනි. ඒ අනුව, සමාජයීය සහ දේශපාලන වශයෙන් බෙලහීන කරනු ලැබූ කණ්ඩායම්වලට සූරාකෑමේ සහ මර්දනකාරී සීමාවන්ගෙන් නිදහස්වීම සඳහා ක්‍රියාත්මක වීමට ඉඩ සැලසේ. එවන් ජනතා බලය විවිධ ආකාරයේ අවිහිංසා අරගල ස්වරූපයෙන් ඉස්මතු විය හැකිය. ඒවා පෙළපාලි, වර්ජන සහ සහයෝගය නොදීම හා (ආර්ථික) වර්ජන ආදී වශයෙන් වූ පරාසයක පවතී.

මේ ආකාරයෙන් බලන කල දිග්ගැසුණු ප්‍රචණ්ඩ ගැටුම් වශයෙන් හැඳින්වෙන්නේ මූලික වශයෙන් අසමාන සහ මර්දනකාරී සමාජ සහ දේශපාලන ව්‍යුහයන්ගේ ප්‍රතිවිපාකයයි. මීට එරෙහිව සාර්ථක අන්දමින් ක්‍රියා කිරීම සඳහා අවිහිංසක අරගල ස්වරූපයෙන් පර්යන්ත කණ්ඩායම් බලගැන්වීම සහ පිළිගැනීම අවශ්‍ය වෙයි. ප්‍රාදේශීය තලයේදී ක්ෂණික අවධානයට ලක්විය යුතු කරුණු පිළිබඳව කටයුතු කළ හැක්කේ මේ ආකාරයෙන් පමණි; නැතහොත් ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම සඳහා සහ හොඳ හිතින් සාකච්ඡාවලට එළඹීම සඳහා පථ I (සහ පථ II ක්‍රියාකාරී) මත සුදුසු පරිදි බලපෑමක් ඇති කළ යුතු වේ.

සෝමාලියාව පදනම් කරගෙන නිදර්ශනාත්මක උදාහරණයක් නැවතත් 1990 ගණන්වල මුල් භාගයේ දී දැකගත හැකිය (ලෙඩෙරාච් 1997). උඩු අත් ප්‍රවේශයන් ආරම්භ වූයේ යුද්ධය කෙසේ අවසන් කළ හැකිද යන්න පිළිබඳව සාකච්ඡා සහ එකඟතා රාශියක් සමගය. ඒවා පවත්වන ලද්දේ ප්‍රාදේශීය සාම සම්මේලන අභ්‍යන්තරයේය. එහිදී විවිධ උප-වංශ එක්තැන් කරනු ලැබීය. එක් එක් වංශයේ බිය සහ ඕනෑඑපාකම්වලට හේතු වන කාරණා හරියාකාරව ඉදිරිපත් කළ හැකි නීත්‍යානුකූල නියෝජිතයන් කැඳවීමට මෙම සම්මේලන පරිස්සම් විය. ඒ අනුව ප්‍රාදේශීය තලයන්හි දී ක්ෂණික අවධානය ලක්විය යුතු කේන්ද්‍රීය වැදගත්කමකින් යුත් කරුණු ඉදිරිපත් කරන ලදී. මෙම ප්‍රාදේශීය සම්මේලන ගිවිසුම් කරා එළඹෙන විට ඒ හා සමාන තීරණ ගැනීමේ ක්‍රියාවලියක් ඉහළ තලයන්හි දී නැවත ක්‍රියාත්මක විය. එයට හැකි පමණ පුළුල් වූ වංශ පරාසයක් ඇතුළත් විය.

පථ I සහ පථ II ක්‍රියාකාරීන් ගැටුම් සමථ සහ ගැටුම් නිරාකරණ ප්‍රවේශයන්හිදී සිවිල් ජනතාව සහ බිම් මට්ටමේ අය නිෂ්ක්‍රීය පිරිසක් සේ සැලකීමට නැඹුරු වූ නමුත් පථ III හි ක්‍රමෝපායයන් ඔවුන් කරළිය මැදට ගෙනාවේය. ඒ අනුව ගැටුම් ව්‍යාවර්තනය, පෙර පැවැති ගැටුම් නිරාකරණය සහ ගැටුම් සමථය යටතේ මෙන් මූලික වශයෙන් තුන්වන පාර්ශවයේ මැදිහත්වීමක ප්‍රතිඵලයක් නොවන්නේය.

වර්තමාන ප්‍රචණ්ඩ ගැටුම් පිළිබඳ සන්දර්භය යටතේ අපේක්ෂිත සාමය ගොඩනැගීමේ ක්‍රියාකාරකම්වල සංකීර්ණ ස්වභාවය සහ ගතිකත්වය පිළිබඳ පූර්ණ සහ සතුටුදායක අවබෝධයක්

ලබාදීමට පථ I නැතිනම් පථ II ප්‍රවේශයන් ගෙන් එකකට හෝ (නැතිනම් දෙකම එක්ව) හැකිවේද යන්න පැහැදිලි නැත. මෙම කාරණය පථ III ක්‍රමෝපායයන් ඇතුළත් කිරීමේ අවශ්‍යතාව පෙන්නුම් කරනු පමණක් නොව ඊට අමතරව එයින් හැඟෙන්නේ විවිධ ප්‍රාදේශීය, ජාතික හා ජාත්‍යන්තර ක්‍රියාකාරීන් අතර අභ්‍යන්තර සාම කණ්ඩායම් හෝ ක්‍රමෝපායික සංවිධාන ඇති කිරීමට නම් අභ්‍යාසයෙහි යෙදෙන්නන් විසින් පථ තුනෙහිම ක්‍රියාකාරකම් එකට සම්බන්ධ කළ යුතු වෙයි.

මෙයින් හැඟීයන්නේ පථ තුනේම ක්‍රමෝපායයන් වඩාත් හොඳින් තේරුම්ගත හැක්කේ ඒවා ඒකාබද්ධ සහ අනුපූරක වූ විට බවයි. එමෙන්ම පෙරකී දේ අනුව මෙම ගැටුම් මැදිහත්වීම් තුන් වර්ගයම ගැටුමක ජීවන චක්‍රය තුළ නිසි තැනක් ගන්නා බව පැවසීම සාවද්‍ය නොවේ. ඒ අනුව පථ II සහ පථ III හි ක්‍රියාකාරකම් සමහරවිට පථ I හි ක්‍රියාකාරකම්වලට අනුපූරකයක් විය හැකිය. එසේ වුවත් ඒවා අසාර්ථක වූ සේ පෙනී යන පථ I හි ක්‍රමෝපායයන් සඳහා ආදේශකයක් වශයෙන් හෝ කෝකටත් තෛලයක් ලෙස හෝ නොසැලකිය යුතුය. මෙහි දී යමෙකු ඊශ්‍රායල් සහ පලස්තීන ජාතිකයන් අතර, සාම සාකච්ඡා සඳහා පහසුකම් සැලසූ නෝර්වීජියානු යුවල පිළිබඳ උදාහරණය වෙත යොමු වන්නට ඉඩ තිබේ; ඔවුන්ගේ කටයුතු සාර්ථක අන්දමින් නිල සාකච්ඡා සඳහා පදනම දමූ අතර කිසිම අවස්ථාවක දී වැදගත් කරුණු පිළිබඳව සාකච්ඡා මගින් සමථ කර ගැනීම සඳහා වූ අවශ්‍යතා මග හැරියේ නැත (ලෙඩෙරාච් 1997, 34 පිටුව බලන්න).

එම නිමිත්තෙන්ම දීර්ඝ කාලීන සමඟි සන්ධානයක් සහ සමාජ යුක්තියක් සඳහා වූ උසස් අපේක්ෂාවන්ට මුහුණදීමට තරම් පථ I ක්‍රියාකාරකම් සහ ක්‍රමෝපායයන් මනා සේ සන්නද්ධ වී නොතිබෙන්නට පුළුවන. පථ III ක්‍රියාකාරකම් මෙම පුළුල් පරමාර්ථයන් පෝෂණය කිරීමට ඉඩ ඇති අතර බලය බෙදීම සඳහා වූ සුළු ජාතික අයිතිවාසිකම් පිළිබඳ ආදර්ශ ද, නීති හා පාලන ව්‍යුහයන්ට අදාළ ජාතිකත්ව සීමා හරහා පැවතිය යුතු ස්වයං පාලන ආදර්ශයන් ද ගැබ් වූ I පථය මට්ටමේ ව්‍යුහාත්මක වෙනස්කම් මඟින් අනුපූරණය නොවුවහොත් අවසානයේදී ඒවා නිෂ්ඵල හෝ සපුරා අසාර්ථක විය හැකිය.

පාදක වන්නා වූ උපකල්පනය වන්නේ ගැටුම් කළමනාකරණය සම්බන්ධයෙන් වූ එක් ප්‍රායෝගික හෝ න්‍යායාත්මක ප්‍රවේශයක් මත ඒකායන බලාපොරොත්තු තැබීම හේතු කොට ගෙන දිග්ගැසුනා වූ බොහෝ ගැටුම්වල සාමාන්‍යයෙන් පෙන්නුම් කරනු ලබන හේතු සහ ප්‍රතිඵලවල සංකීර්ණතා සහ පරස්පර විරෝධතා පිළිබඳව සාර්ථක අන්දමින් ක්‍රියා කිරීමට අපොහොසත් වන බවයි. මෙම කාරණයේ තර්කානුකූල විස්තාරණය විය හැක්කේ පථ I, II සහ III ක්‍රියාකාරකම් සමායෝගය සහ සංස්ලේෂණය සඳහා ප්‍රයත්න දැරීමයි. මෙය ප්‍රායෝගික තලයේ පමණක් නොව න්‍යායාත්මක තලයේ ද සිදුවිය යුතුය. අතීතයේදී ගැටුම් කළමනාකරණය පිළිබඳ විද්වතුන් විවිධ න්‍යායාත්මක ප්‍රවේශයන් වන ක්‍රීඩා න්‍යාය, මානව අවශ්‍යතා න්‍යාය සහ අවිහිංසා න්‍යාය සංස්ලේෂණය සඳහා කැමැත්තක් දැක්වූයේ නැත. (මෙම න්‍යායයන් සංස්ලේෂණයට විද්වතුන් කටයුතු කර තිබිය හැකි වුවත් ඇත්ත වශයෙන්ම ඒ පිළිබඳව පැහැදිලිව විස්තර කර නැත).

මෙය නොසිදු වීම පිළිබඳව සිතාගත හැකි හේතු කිහිපයක්ම ඇත. පළමුව, කළමනාකරණ තර්කය කෙරෙහි යොමු වී පවතින ගැටුම් සමථය දැනට පුළුල් වශයෙන් අභාවයට ගොස් තිබෙන සැබෑ

දේශපාලන බල පරාමිතිය හා සම්බන්ධ සේ සිතාගත හැකිය. විශේෂයෙන්ම ගැටුම් කළමනාකරණ ක්ෂේත්‍රයේ මෙහෙයවන ලද ආරම්භක වැඩකටයුතුවලදී විද්වතුන් යොමුවීමට නැඹුරු වූයේ චින්තන පර්ෂදයන් අතර තිබෙන්නා වූ සමානකම් සොයාගන්නවාට වඩා වෙනස්කම් හඳුනා ගැනීමට බව ගැටුම් සමථකරණ සහ ගැටුම් නිරාකරණ ප්‍රවේශයන්ගේ පරස්පර සහලක්ෂණ පිළිබඳ සාකච්ඡාවේදී සෑහෙන ලෙස පැහැදිලි වෙයි. සාමාන්‍ය වශයෙන් ගත් කල මෙම ක්ෂේත්‍රය බොහෝ කාලයක් තිස්සේ මනාව ස්ථාපිත වූ ද්විභේදී මානසිකත්වයක පවතින බව තහවුරු වේ: මෙම ද්විභේදනය වන්නේ ගැටුම ආත්මමූලක පදනමකින් තේරුම් ගැනීමට එරෙහිව විෂයමූලක විරෝධය සමඟ ගැටුම් නිරාකරණ ක්‍රමෝපායයන් සමග සංසන්දනය කිරීමේ ගැටුම් සමථකරණයයි.

ඉහතින් දක්වා ඇති පරිදි ගැටුම් නිරාකරණය කෙරෙහි යොමු වී සිටින එම විද්වත්හු උදාහරණයක් වශයෙන් ගැටලු විසඳීමේ වැඩමුළු සංවිධානය කරමින් කටයුතු කරන විට අතිශයින් වෙනස් වූ පාදක ව්‍යුහයන් යොදාගැනීමට නැඹුරු වෙති (එනම් අවශ්‍යතා සහ භීතීන් සටහන් කර තැබීම). මෙය අපේක්ෂා සහ චර්යා පිළිබඳ හේතුවාදී ආකෘති කෙරෙහි අවධානය යොමු කරන්නා වූ ගැටුම් සමථකරණ විද්වතුන් අභිබවා යාමකි (ක්ලෙමන්ට්ස් 1998, 136 පිටුව බලන්න). ප්‍රවේශයන් අතර දිගටම පවතින්නා වූ වෙනස්කම්වලට අවසාන සහ වඩාත් පොදු හේතුවක් විය හැක්කේ සමහර විද්වතුන් ඔවුන්ගේ කාර්‍යය පැහැදිලි උපකල්පනයන්ට වඩා ගම්‍යමාන උපකල්පනයන් මත පදනම් කොට ගැනීම හේතුවෙන් ඔවුන්ගේ තර්කයෙහි න්‍යායාත්මක ප්‍රතිෂ්ඨාවන් ප්‍රබලව ප්‍රකාශ කිරීමට අසමත්වීම විය හැකිය.

ගැටුම් ව්‍යාවර්තනය යනු පෙර පැවති ආදර්ශවල සංකල්පීය සහ ප්‍රායෝගික ව්‍යාප්තියක් මෙන්ම ප්‍රයෝජනවත් වූ සංයෝජනයක් හැටියට යමෙකු සලකන්නේ නම්, එය ක්‍රීඩා න්‍යාය, විචාරශීලී තේරීම, මානව අවශ්‍යතා න්‍යාය සහ අවිහිංසාවාදී චර්යාව ආදියේ කිසියම් ආකාරයක සංස්ලේෂණයක් සහිත වූවක් වීම යහපත් දෙයක් වනු ඇත. ප්‍රශ්න විසඳීමේ වැඩමුළු තුළින් පැහැදිලි උදාහරණයක් සොයාගත හැකිය. ඒවාට ආභාසය ලැබුණේ ගාන්ධි, කිං සහ ෂාප් වැන්නන්ගේ අවිහිංසාවාදී වූ විවිධ මූලාශ්‍රවලිනි. ඔවුන් සියලු දෙනාම අවධාරණය කළේ ප්‍රතිවාදියාට ගරු කිරීමේ අවශ්‍යතාව සහ අන්‍යොන්‍ය වශයෙන් වාසිදායක ප්‍රතිඵල සෙවීමයි (මිචෙල් 1981, 71-86 පිටු). අන්‍යොන්‍ය වශයෙන් වාසිදායක ප්‍රතිඵල වන්නේ, බොහෝ ක්‍රීඩා න්‍යාය ප්‍රවේශයන්හි එන එක් මූලික සංකල්පයක් සහ අරමුණකි.

කෙටියෙන්, අනු-පූරක සම්බන්ධය මුඛ්‍ය කාරණය හැටියටත් මතුපිටින් පෙනෙන ආකාරය අනුවත් පිළිගන්නේ නම් එය ස්වභාවයෙන් න්‍යායාත්මක විය යුතු අතර, ක්‍රීඩා න්‍යායය, මානව අවශ්‍යතා න්‍යාය සහ අවිහිංසාවාදී චර්යාව අතර අන්‍යොන්‍ය ප්‍රතිපෝෂණයක් හෝ උපක්‍රමශීලී සහසම්බන්ධයක් ඇති කළ යුතුය. ගැටුම් න්‍යායය, මානව අවශ්‍යතා සහ අවිහිංසාවාදී චර්යාවන් පදනම් කරගෙන විවිධ අවබෝධාත්මක තත්ත්වයන් සංශ්ලේෂණය කරන අතරතුර ගැටුමේ ස්වභාවය ගැන තෙයාකාරව අවබෝධ කර ගැනීමක් තුළින් ගැටුම් ව්‍යාවර්තන ක්‍රමෝපාය ආරම්භ කළ යුතුය.

මෙම චින්තන නිකාය දකින පරිදි ගැටුම පළමුව හා නිරතුරුව දේශපාලන අධිකාරය සහ සමාජ වෙනස්වීම සඳහා වන උත්ප්‍රේරකයක් ලෙස දකිනු පමණක් නොව සමාජ යුක්තිය සඳහා වන

අවිහිංසාවාදී අරගලයක ස්වභාවික ප්‍රකාශනයක් ලෙස ද දකී. ඒ අනුව ගැටුම් ව්‍යාවර්තනය ගැටුම දෙයාකාරයකින් තේරුම් ගනී. එනම් සමාජ අධිකාරයේ සහ වෙනස්වීම යන දෙකේම නියෝජිතයෙකු වශයෙනි (ක්ලෙමන්ට්ස් 1998, 138 පිටුව).

තවද ගැටුම් ව්‍යාවර්තනය මෙතැනින් නොනවතී. එය ගැටුම් නිරාකරණය සහ ගැටුම් සමථය අතර තිබෙන්නා වූ ද්විභේදනය මූලික වශයෙන් ප්‍රති-නිර්වචනය ද කරයි. සමාජ යුක්තිය පිළිබඳ ප්‍රශ්නය වෙත එහි මූලික අවධාරණය යොමු කරමින් ගැටුම් ව්‍යාවර්තන ප්‍රවේශය ගැටුම් කළමනාකරණයේ සාම්ප්‍රදායික බලාපොරොත්තුව වූ පූර්ව ස්ථිති-සංරක්ෂණය ප්‍රතික්ෂේප කරයි; ඒ වෙනුවට ගැටුම පිළිබඳ මතය සමාජ වෙනස සඳහා සාධනීය නියෝජිතයෙකු වශයෙන් විස්තර කරයි.

ගැටුම් ව්‍යාවර්තනය වනාහි විවෘත, එයට සම්බන්ධ වී සිටින්නා වූ ක්‍රියාකාරීන්ගේ විෂය පථය සැලකිය යුතු අන්දමින් පුළුල් කරන දීර්ඝකාලීන, බහුපථ සහ ගතික ක්‍රියාවලියකි. එය පථ I, II සහ III හි ක්‍රියාකාරකම් අඛණ්ඩව කෙටි, මධ්‍ය සහ දීර්ඝ කාලීන සහභාගීත්වය අනුව යමින් සාර්ථක අන්දමින් සම්බන්ධ කරයි. ඒ අනුව එය පුළුල් පරාසයකින් යුත් ක්‍රියාකාරීන් වන රාජ්‍ය නිලධාරීන්, හමුදා නිලධාරීන් හා දේශපාලන නායකයන් සම්බන්ධ කර ගැනීමට ඉඩ ඇත (පථ I). තවත් අයවන්නේ, අවිධිමත් ගැටුම්-නිරාකරණ විශේෂඥයන්, ගැටුම් කළමනාකරණය පිළිබඳ කටයුතු කරන ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන සහ රාජ්‍ය නොවන සංවිධාන (පථ II) සහ සංවර්ධන සහයෝගතාව සහ මානුෂවාදී ආධාර සපයන පොදු ජන සහ දේශීය රාජ්‍ය නොවන සංවිධානයි (පථ III). එතරම් පුළුල් අයුරින් භාවිත කරන ප්‍රවේශයක් තවදුරටත් "පහළ මට්ටමේ සිට සාමය ගොඩනැගීම" යන ලේබලය යටතේ අවතක්සේරු නොවිය යුතු මෙන්ම නොකළ යුතු ද වන්නේය. ගැටුම් පිළිබඳව මෙම තුන් ආකාර වටහා ගැනීම වැඩි දුරටත් ඒවාට අනුරූපී වන්නා වූ ජයග්‍රහණයේ තුන් වැදෑරුම් අර්ථ නිරූපණයක් දක්වයි: එය ප්‍රතිඵලය, ක්‍රියාවලිය සහ / හෝ වෙනස කෙරේ නැඹුරු වූවක් විය හැකිය.

ප්‍රතිඵල ගැන සලකා බලන කල්හි, ගැටුම් ව්‍යාවර්තනය මගින් සාක්ෂාත් කර ගැනීමට බලාපොරොත්තු වන්නේ ගැටුම්වලට මැදිහත්වී සිටින්නා වූ පාර්ශ්වයන්ගේ අවශ්‍යතා සහ බිය සැක මගින් මතු කර ඇති වැදගත් ගැටලු සඳහා වූ සමථකරණයකි. මෙහි මූලික අංග දෙකකි: පළමුවැන්න, පාර්ශවයන් අතර පවත්නා ඍණාත්මක ගැටුම්කාරී ආකල්ප සහ ඇගැයීම් අන්‍යෝන්‍ය වශයෙන් වෙනස් කිරීමේ අවශ්‍යතාව අවධාරණය කරන ක්‍රියාවලි කෙරේ නැඹුරු ප්‍රවේශයකි. මෙය ඒවා අතර සහයෝගය හා සන්නිවේදනය වර්ධනය කිරීම සඳහාය. දෙවැන්න, දේශපාලන අත්‍යවශ්‍යතාව අවධාරණය කෙරෙන වෙනසකට නැඹුරු වන්නා වූ ප්‍රවේශයකි. එය අවශ්‍ය වන්නේ අඩු වරප්‍රසාද ලත් කණ්ඩායම් බලගැන්වීම සහ ඔවුන්ට පිළිගැනීමක් ලබාදීම සඳහා අලුත් පොදු කාර්ය ව්‍යුහයක් නිර්මාණය කිරීම සඳහාය. ඒ මගින් සමාජ සාධාරණය අභිවර්ධනය කිරීම හා ශක්තිමත් කිරීම සිදු වේ. කෙටියෙන් පවසනවා නම් පෞද්ගලික සහ අනුෂාංගික තලවල මූලික අවශ්‍යතා සපුරාලීම ප්‍රමාණවත් නොවේ. ඒ වෙනුවට, වෘත්තිකයන් විසින් සම්පත්වලට සමාන ප්‍රවිෂ්ටවීම සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කළ යුතු අතර ම, දීර්ඝ කාලීන සමාජ ප්‍රතිසංස්කරණ සහ සමගි සන්ධානය ඉලක්ක කරගෙන ව්‍යුහාත්මක අසමානතා ගැන සලකා බලනු පිණිස යටිතල පහසුකම් එකලස් කළ යුතු වේ.

ගැටුම් ව්‍යාවර්තන ප්‍රවේශය යටතේ සාර්ථක ප්‍රතිඵලයක් නිර්වචනය කිරීම වඩාත් අසීරු වේ. මක්නිසාද යත්, සාමය යන්න දැන් ධනාත්මකව නිර්වචනය කෙරෙන හෙයිනි. විවිධ ආකාර වූ ව්‍යූහාත්මක සහ සංස්කෘතික ප්‍රචණ්ඩත්වය වෙත අනුක්‍රමික ආකාරයෙන් අවධානය ලක් කරන කල්හි ඍණාත්මක සාමයේ විවිධ ස්වරූපයන් අභිබවා යා යුතු වේ. වර්තමානයේ දී දිග්ගැස්සී තිබෙන බොහෝ ගැටුම් සඳහා සමාජ සම්බන්ධතා සහ සමාජ ව්‍යූහයන් සර්වාංග පූර්ණ ව්‍යාවර්තනයට නොඅඩු දෙයක් අවශ්‍ය වේ.

4. උපයුක්ත න්‍යාය සහ පර්යේෂණ ක්‍රමයන්හි කාර්යභාරය

පොදුවේ ගත් කල, ගැටුම් කළමනාකරණ ක්ෂේත්‍රය සහ විශේෂයෙන් මෙම ප්‍රවේශයන් තුන ස්පර්ශ කරනුයේ න්‍යාය සම්බන්ධ කරුණු කිහිපයක් පමණි. උදාහරණයක් වශයෙන්, ජාත්‍යන්තර සම්බන්ධතා පිළිබඳ මෑතක දී ඇති වූ විවාදවලට ප්‍රතිපක්ෂ ව ගැටුම් කළමනාකරණ ක්ෂේත්‍රය න්‍යායාත්මක අධ්‍යයනවලින් බොහෝ සේ ඈත් වී පැවතුණි. මෙය විශේෂයෙන්ම ඇති වූයේ විද්‍යාත්මක විමර්ශනවල ඇති අවශ්‍යතාව, උපයුක්ත ක්‍රමවේද සහ දැනුමේ යුක්ති යුක්ත බව වැනි කරුණු පිළිබඳව සත්භාව විචාරාත්මක සහ ඥාන විභාගාත්මක ප්‍රශ්න සම්බන්ධයෙනි.

පහත දැක්වෙන විශ්ලේෂණය මගින් මෙම දැඩි විවේචනය නිදර්ශන සහිතව පැහැදිලි කෙරෙයි. ගැටුම් කළමනාකරණය සඳහා වන විවිධ ප්‍රවේශ පිළිබඳව න්‍යායාත්මකව කරුණු දැක්වීමේ දී එය අවශ්‍යයෙන්ම ගැටුම සම්බන්ධ විශේෂිත න්‍යායයක් මත පදනම් විය යුතු බව සුලභ සත්‍යයකි. ඒ අනුව යමෙකු බලාපොරොත්තු විය යුත්තේ ගැටුම් කළමනාකරණය පිළිබඳව කෙරෙන ඕනෑම න්‍යායාත්මක සලකා බැලීමක් ආරම්භ වන්නේ ප්‍රචණ්ඩ ගැටුම මූලික වශයෙන් තේරුම් ගැනීමක් පිළිබඳව කෙරෙන න්‍යායාත්මක විවාදයකින් බවයි. මේ හේතු කොට ගෙන මතුවන තත්ත්වය හැටියට පෙනී යන්නේ ගැටුම පිළිබඳ එවන් වටහා ගැනීමක් න්‍යායාත්මක පමණක් නොවන බවත්, න්‍යායයික සහ ප්‍රායෝගික වශයෙන් ගැටුම් කළමනාකරණ සහ ගැටුම් ව්‍යාවර්තනය සඳහා මූලික වශයෙන් වෙනස් වූ අවසාන තීරණයන් කරා යා යුතු බවත් ය.

ගැටුම් කළමනාකරණ ලිපි ලේඛන මතුපිටින් පරිශීලනය කරන විට පවා දිස්වන ඛේදජනක තත්ත්වය නම් බොහෝ ගැටුම් කළමනාකරණ ප්‍රවේශ සහ ක්‍රමෝපායයන් පුළුල් හෝ නිරවුල් න්‍යායාත්මක සංකල්ප මත පදනම් වී නැති බවයි (සිමෙක්කා 1993, 211-221 පිටු). සාමාන්‍ය වශයෙන් ක්ෂේත්‍රය "සෑහෙන ප්‍රමාණයකින් න්‍යාය ගොඩනැගීම අභිබවා" ගොස් ඇති බව පෙනේ (වෝල් සහ ලින් 1993, 182 පිටුව). ඒ අනුව සිමෙක්කා අවධාරණය කරන්නේ "ගැටුම් අවස්ථාවලදී මැදිහත්වීමේ ශිල්ප ක්‍රම කුමන අවස්ථාවක, කවරකු විසින්, කුමන හේතුවක් මත භාවිත කටයුතු දැයි නියත වූ න්‍යායාත්මක යුක්ති ස්වභාවයක් නොමැත" යනුවෙනි (සිමෙක්කා, එම, 217 පිටුව). බොහෝ පර්යේෂණ විධිමත් න්‍යායාත්මක මෙහෙයවීමක් මත සිදුනොවීම පුදුම සහගත නොවේ (ව්‍යතිරේකයන් විය හැක්කේ ස්ටෙඩ්මාන් 1991 සහ ප්‍රින්සෙන් 1992 කෘතිවල පිළිගත හැකි පරිදි න්‍යායාත්මකව මෙහෙයවන ලද (තුලනාත්මක) විෂය අධ්‍යයනයන්ය).

වේබර්ගේ සමාජ විද්‍යාවෙන් උකහාගත් න්‍යායාත්මක පාදක ව්‍යූහයක් ඇති කිරීම සඳහා සිමෙක්කා කරුණු ගොනු කරන්නේ මේ හේතු කොට ගෙනය (වේබර් 1948): ඔහු කරුණු ඉදිරිපත්

කරමින් කියා සිටින්නේ වෙබර්ගේ ගැටුම් න්‍යාය, ගැටුම් කළමනාකරණය සඳහා වූ විවිධ ප්‍රවේශයන්හි ප්‍රායෝගික හා න්‍යායයික අංග ඇතුළත් සර්වග්‍රාහී පාදක ව්‍යුහයක් වශයෙන් ප්‍රයෝජනයට ගැනීම සඳහා එය විසින්ම අවස්ථාවක් ලබාදෙන බවයි. වේබර්ගේ සමාජ විද්‍යාව කෙරෙහි සම්පූර්ණ විශ්වාසය තැබීම බොහෝ විද්වතුන් විසින් අභියෝගයට ලක්කිරීමට ඉඩ ඇති නමුත්, සිමෙක්කා මතු කරන වැදගත් ප්‍රශ්න අදාළ වී තිබෙන්නේ ගැටුම් කළමනාකරණ ක්ෂේත්‍රයේ න්‍යායාත්මක දුබලතා සහ එහි පැහැදිලි ගැටුම් න්‍යායයක් නොමැතිවීම ගැනයි.

මූලික වශයෙන් සැලකිලිමත් විය යුතු දේ වශයෙන් පෙනී යන්නේ ගැටුම් කළමනාකරණ න්‍යායයේ සහ ව්‍යවහාරයේ උපකල්පනය කරන ලද යථාර්ථයන් බොහොමයක් ඇත්ත වශයෙන්ම ගම්‍ය වන්නා වූ න්‍යායාත්මක ගැටුම් පිළිබඳ පාදක ව්‍යුහයක් විසින් ආරෝපණය ලද ඒවා බවයි (ඉහත දී සාකච්ඡා කරන ලද ගැටුම පිළිබඳ විෂයමූලක සහ ආත්මමූලක වටහා ගැනීම් මෙනි). ඒ ඇරත් න්‍යායයේ කාර්යභාරය තේරුම් ගැනීම සීමා වූ විට පවා ඒවා ක්‍රියාත්මක වන බව පෙනේ. ගැටුම් කළමනාකරණ ක්ෂේත්‍රයේ පැහැදිලිවම පෙනෙන න්‍යායය පිළිබඳ අර්ථ නිරූපණය සාමාන්‍යයෙන් එක්තරා ආකාරයක නිරීක්ෂණාත්මක හෝ පුද්ගලික අත්දැකීමක පැහැදිලි කිරීමකට සීමාවෙයි; ඒ දෙස බලනු ලබන්නේ ප්‍රතිඵල වශයෙන් පසුව එන ප්‍රතිපත්ති නිර්දේශවලට අනුරූප වූ හේතු කාරක තර්කයන් ලෙසය.

කිසියම් න්‍යායයක අත්‍යන්ත පරීක්ෂණය දැකගත හැකි වන්නේ එහි ප්‍රයෝජනය සහ ශිල්පීය යෝග්‍යතාවේ ප්‍රමාණය අනුවයි. එය තීරණය වන්නේ එම න්‍යායයේ අවසන් ඉලක්කය වන ප්‍රචණ්ඩ ගැටුම් සමථය වැනි අවස්ථාවක් කරා ප්‍රතිපත්ති මෙහෙයවීමට සහ නැඹුරු කිරීමට උත්සාහ ගන්නා විටයි. අවධාරණය යොමුවන්නේ ගැටුම් කළමනාකරණ අභ්‍යාස වෙත නම් (එනම්, එළියේ ඇති නියම ලෝකය ගැන නම්) විද්වතෙකු හෝ වෘත්තිකයෙකු න්‍යායය පිළිබඳව සැලකිලිමත් වීම අවශ්‍ය නැතැයි යමෙකුට තර්ක කළ හැකි ද? අන් කිසිවක් හැර මේ අන්දමින් කල්පනා කිරීම නියත වශයෙන්ම හෙළි කරන්නේ ගැටුම් කළමනාකරණ ක්ෂේත්‍රයේ දී න්‍යායයට අයිතිවන සාමාන්‍ය තත්ත්වය බොහෝ සීමිත අයුරින් තේරුම් ගැනීම බවයි; මෙසේ සිදුවන්නේ ගැටුම් කළමනාකරණ පර්යේෂණ බොහොමයක් න්‍යායය ආනුභවික වශයෙන් අවබෝධ කර ගැනීමේ ප්‍රවේශය සමග කටයුතු කරන බව පෙනෙන බැවිනි.

මේ අනුව න්‍යායය මගින් පළමුවෙන්ම තාත්වික ලෝකය වඩාත් නිවැරදිව විශ්ලේෂණය කිරීමට සහ විස්තර කිරීමට (සමහරවිට ඒ ගැන අනාවැකි කීමට) විද්වතුන්ට සහ වෘත්තිකයන්ට පහසුකම් සැලසෙන මූලික ආකෘතියක් ලබාදිය යුතු වේ. උපකල්පනය කරන ලද මෙම ගැටුම් කළමනාකරණය පිළිබඳ තාත්වික ලෝකය සමන්විත වන්නේ සහ වට වී තිබෙන්නේ ගැටුම් පාර්ශවයන්ගේ චර්යාව සහ මැදිහත් වන්නා වූ විචල්‍යයන්ගෙනි. ඒවා නම්, තුන්වන පාර්ශවීය ගතිලක්ෂණ, සම්පත් සහ බලපෑම්, ප්‍රවීණත්වය සහ ප්‍රතිදානන වැනි ක්‍රමෝපායයන් ආදියයි (බර්කෝවිච් 1992, පිටු 10-21 බලන්න). න්‍යායය මේ ආකාරයෙන් අවබෝධ කරගන්නේ නම් ගැටුම් කළමනාකරණ ක්ෂේත්‍රයට "න්‍යාය-පර්යේෂණ-අභ්‍යාස ලූපය" කරා ප්‍රවේශවීම සඳහා අවම වශයෙන් මාර්ග හතරක් හඳුනාගත හැකිය (පිෂර් 1997 b, 263 පිටුව).

ස්ටෙඩ්මාන් (1991), බර්කෝවිච් සහ රූබින් (1992), රූබින් (1981) ප්‍රින්යෙන් (1992) සාර්ට්මාන් (1985) සහ ජබ්රි (1990) වැනි සමහර විශ්ලේෂකයන් විසින් අසාර්ථක හෝ සාර්ථක වශයෙන් ප්‍රත්‍යක්ෂ කරගනු ලැබූ ගැටුම් කළමනාකරණ පිළිබඳව සංසන්දනාත්මක, විස්තරාත්මක සහ ආනුභවිකව කැරුණු ප්‍රත්‍යෙක අධ්‍යයන වාර්තාවල එකතුවක් ඉදිරිපත් කර ඇත (නෙගෝසියේෂන් ජර්නල් සහ ඉන්ටර්නැෂනල් නෙගෝසියේෂන් සඟරාවල බොහෝ කලාප බලන්න). විධිමත් න්‍යාය-පූර්වක තුලනාත්මක ප්‍රත්‍යෙක අධ්‍යයන සම්මතයට වඩා ව්‍යතිරේකයක් සේ පෙනේ.

වෙනත් අවස්ථාවල දී බර්කෝවිච් සහ වෙල්ස් (1993) සහ නිකොල්සන් (1992) බලාපොරොත්තු වන්නේ සාර්ථක ගැටුම් කළමනාකරණයේ සංයුතිය කුමක්ද යන වග සොයා ගැනීමට සහ විධිමත්වතා සහ සහසම්බන්ධතා හෝ අවම වශයෙන් හේතු-කාරක නිර්වචන ගවේෂණය කොට වර්ධනය කිරීමටයි. ඔවුන් ප්‍රමාණාත්මක ක්‍රම භාවිත කරමින් ආරෝහණ ලෙස න්‍යායයන් නිර්මාණය කරන්නේ උදාහරණයක් වශයෙන්, මැදිහත්වීම සම්බන්ධ සන්දර්භානුගත විචල්‍යයන් පරික්ෂා කර බැලීමට සහ ඒ පිළිබඳව උපන්‍යාසයන් ගොඩනැගීමටය. මේවා මැදිහත්කරුවන්ගේ අනන්‍යතාව සහ තරාතිරම් ගැන සැලකිලිමත් වන ඒවා විය හැකිය. මේ ආකාරයේ පර්යේෂණ ඵලදායී ගැටුම් කළමනාකරණය පිළිබඳව බර්කොවිච්ගේ අධ්‍යයන මෙන් මහා පරිමාණ ඵලදායී, ක්‍රමානුකූල අධ්‍යයනවල ස්වරූපය ගනු ඇත; එසේ නොමැති නම්, රූබින් (1980) විසින් පෙන්වාදීමට උත්සාහ කර ඇති තුන්වන පාර්ශවයේ මැදිහත්වීම සඳහා වඩාත් අත්හදා බැලීම් සහ පර්යේෂණාගාර ක්‍රම පදනම් වූ ප්‍රවේශයන්ගෙන් සමන්විත වනු ඇත. මහා පරිමාණ අධ්‍යයන විශේෂයෙන්ම සමීප වශයෙන් අනුගමනය කරනු ලබන්නේ දේශපාලන තීරණ ගනු ලබන්නන්ට අවශ්‍ය වන ප්‍රතිපත්තිවලට අදාළ සොයාගැනීම් උත්පාදනය කිරීම සඳහාය (බර්කෝවිච් 1997).

පිෂර් සහ යුරි (1981) සහ සිය මුල් කෘතිය තුළින් විශේෂයෙන් බර්ටන් (1969) වැනි විද්වත්හු ස්වභාවයෙන් අඩු ආනුභවික තත්ත්වයක් පෙන්නුම් කරමින් ඒ වෙනුවට, තරමක් විස්තරාත්මක, සමහරවිට ආඛ්‍යානමය සහ නිර්දේශාත්මක ස්වරූපයක් අනුගමනය කළහ. මෙම ප්‍රවේශය උද්ගාමී (inductive) මත නිර්මාණය කිරීමකි: එහි බොහෝ අනුගාමිකයන් ඉදිරිපත් කරන්නේ "... තනි වෘත්තිකයෙකුගේ අත්තනෝමතික ප්‍රවීණතාවට අනුරූප ක්‍රියාවලි ගණනාවකි" (සිමෙක්කා, ඉහත 214 පිටුව). මේවා බොහොමයක් පවතින්නේ බොහෝ දුරට ස්ථිතික ආකෘති වන..." අභ්‍යාසයේ කේන්ද්‍රීය සංරචකයන් පිළිබඳ උද්ගාමී විස්තර සහ මැදිහත්වීම් සඳහා නිර්දේශිත මාර්ගෝපදේශ සමහරක් සමග" (පිෂර් 1997) වශයෙනි. වඩාත් ම කැපී පෙනෙන උදාහරණය විය හැක්කේ හාවර්ඩ් නෙගෝසියේෂන් ව්‍යාපෘතියේ කටයුතුය.

ගැටුම් කළමනාකරණ ක්ෂේත්‍රයේ දී භාවිතයෙන් ලද අත්දැකීම් පදනම් කරගත් සාක්ෂ්‍ය සහ අනුමාන අතර තිබෙන්නා වූ සියුම් වෙනස ගැන ක්ලෙයිබෝ කරුණු ඉදිරිපත් කරන්නේ ඇය අවධාරණයෙන් සඳහන් කරන පරිදි බොහොමයක්..." පර්යේෂණ සාක්ෂි වශයෙන් ඉදිරිපත් කර ඇති නමුත් පසුව ඔප්පු වන්නේ ඒවාට පදනම් වී ඇත්තේ මූලික වශයෙන් සාමාන්‍යයෙන් අප්‍රකාශිත අනුමාන, මතිමාත්‍ර සහ තත්කාර්ය නිරීක්ෂණයන් බවයි" (ක්ලෙයිබෝ 1996,76 පිටුව). ඇත්ත වශයෙන්ම පිෂර් සහ යුරි (1981) යුරි (1991) සහ බර්ටන් (1987) යන අයගේ සොයාගැනීම් බොහොමයක් ඉදිරිපත් වන්නේ සංග්‍රහ, අත්පොත් හෝ සූප ශාස්ත්‍ර වට්ටෝරු පොත් ආකාරයෙනි. ඒවායේ ඉදිරිපත් කරනු ලබන්නේ සාර්ථක ගැටුම් කළමනාකරණ අභ්‍යාසයන් සඳහා නීති හා උපදෙස්ය (මිචෙල් 1993 බලන්න).

බර්ටන් හා වෙනත් අය විසින් හඳුන්වා දී ඇති, උදාහරණයක් වශයෙන් ප්‍රශ්න විසඳීම සඳහා වූ වැඩමුළු අභ්‍යාස, අදහස් පිළිබඳ උද්ගාමී මත ඉදිරිපත් කිරීම් සහ ගැටුම් හා ගැටුම් නිරාකරණ ක්‍රියාවලි ගැන උපකල්පන සඳහා අවස්ථා ලබාදීමට උපකාරී කර ගැනීමක් දැයි කිසියම් ව්‍යාකූලතාවක් පවතින බව පෙනේ (උදාහරණ වශයෙන් පිෂර් 1997 b, 256 පිටුව; හිල් 1982 බලන්න). එසේ නැතහොත් ඒවා ඒ වෙනුවට ඉදිරිපත් විය හැකි නිගාමී මත නිර්මාණය කිරීමක ප්‍රතිඵලයක්ද? එනම්, ගැටුම් සහ ගැටුම් නිරාකරණය පිළිබඳව සාධාරණීකරණය සහ ඒ අනුව මානව අවශ්‍යතා සම්බන්ධ වඩාත් ජාති-මූලක වූ න්‍යායයකින් උකහා ගැනීමයි (උදාහරණයක් වශයෙන් ෆෙදර්ස්ටෝන් 1991 බලන්න). සමහරවිට ගැටුම් කළමනාකරණ ලිපි ලේඛන බොහොමයක ආවේණිකව පවතින මෙම අපැහැදිලි බව හා පරස්පරතා පෙන්නුම් කරන සාක්ෂි බර්ටන්ගේ කෘතියෙහි තිබෙන්නා වූ සාමාන්‍ය අර්ථ ව්‍යාකූල බව සහ අර්ථ දැක්වීමේ අවිනිශ්චිත බව හා සම්බන්ධ කළ හැකිය. නැතහොත් අඩු වශයෙන් ඔහුගේ අපැහැදිලි කෘතිය වරණාත්මක කියවීමේ ප්‍රතිඵලයක් වශයෙන් මතුවන සාධාරණීකරණයේදී පවා එම සන්දිග්ධතාව හා නිර්වචනාත්මක අවිනිශ්චිත බව දැකගත හැකිය.

එතෙකුදු වුවත්, බර්ටන් (1969), (1972) සහ පිෂර් (1983) විසින් යෝජනා කර ඇති පරිදි විවිධ ආකාර වූ ප්‍රශ්න විසඳීමේ වැඩමුළු අභ්‍යාසයන් ගැන අධ්‍යයන කිරීමේදී පැහැදිලි වන්නේ වඩාත් පොදු එහෙත් ඒ හා සමානවම බැරෑරුම් වූ ප්‍රශ්නයකිඃ මෙම වැඩමුළු අතුරින් බොහොමයක උපකල්පනයන් උද්ගාමී හා නිගාමී වශයෙන් එක් විටම කරන බවක් පෙනේ. මෙය සැලකිය යුතු තරම් පුදුම සහගත කරුණක් නොවන්නේ න්‍යායයන් උත්පාදනය කිරීම සඳහා අවස්ථාවන් වශයෙන් සමහර විද්වතුන් විසින් සලකන ලද ප්‍රශ්න විසඳීමේ වැඩමුළු පිළිබඳව තිබූ මූලික උනන්දුව, න්‍යායයන් ක්‍රමානුකූල පරීක්ෂණයකට භාජනය කිරීම සඳහා ඇත්ත වශයෙන්ම කිසිම අවස්ථාවක යොමු නොවීම ගැන සලකා බලන විටය (මිචෙල් 1993, 89-96 පිටු ද බලන්න).

තවත් සමහරු ගැටුම් කළමනාකරණය සහ ව්‍යාවර්තනයේ දී උද්ගාමී මත නිර්මාණය සඳහා තරමක් වෙනස් මගක් ගනිතිඃ අනිකුත් විදවත්හු 'භූම්‍යස්ථ න්‍යායයේ' (Grounded theory) තදබල බලපෑමට ලක් වී සිටිති (වෙයිස් 1999 බලන්න). එයට අමතරව මානව විද්‍යාවේ සහ මානව වංශ විද්‍යාවේ බලපෑමට ද ලක් වී සිටිති (උදාහරණයක් වශයෙන් වුල්ෆ් සහ හොන්ගෑං 1996 බලන්න). මෙවැනි ගුණාත්මක පර්යේෂණයන්හි මූලික අවධානය යොමු වන්නේ දත්තවලින් පර්යේෂණාත්මක ප්‍රශ්න උකහා ගැනීම සහ දත්ත එකතු කරන අදියර අවසානයේ මේවා වඩාත් සියුම් කිරීමට සහ සමාලෝචනයට පෙරාතුව පරීක්ෂණයට ලක් කිරීම කෙරෙහිය.

මෙම ප්‍රවේශ ක්‍රමවේදීය වශයෙන් වෙනස් නමුත් ඒ සියල්ල විෂයමූලික හා ගුණාත්මක බවින් තොර කිසියම් පර්යේෂණ මතයකින් ප්‍රතිෂ්ඨාව ලබා ඇති අතර බාහිර වූ තථ්‍ය ලෝකය ගැන විෂය මූලික දැනුමක් ලබාගත හැකි බව සහතික කරයි. එම අවබෝධය ආත්මමූලක අත්දැකීම් තුළ පදනම් වී ඇත්ද නැද්ද යන කරුණ වැදගත් නොවේ. මෙම මඟ ගැනීමේ දී එවැනි විද්‍යාත්මක, විෂයමූලක සොයාගැනීම් ඇගයුම් විනිශ්වයන් හා ප්‍රතිපක්ෂතාව තියුණු කරනු පමණක් නොව බෙහෙවින් ආත්මමූලක වූ ඒවාට සාමාන්‍යයෙන් ඥාන විභාගමය ප්‍රමුඛත්වයක් ද ලබාදෙයි.

කර්ලි සහ පුළුල් භූමාස්ථ සමාජ න්‍යායයක පිහිටා කටයුතු කරන එවැනි තවත් විද්වතුන් කීප දෙනෙකු පමණක් මෙම ප්‍රවේශය ප්‍රශ්නයට ලක් කරනුයේ ඒ වෙනුවට ගල්ටුංගේ නිර්වචන කිරීමක් වන "පැහැදිලි උපකල්පනයක් මත පදනම් විෂයමූලකත්වය යනු අන්තර් - විෂයක සංවාදය එනම් අගයන්," ලෙස ගනිමිනි (ගල්ටුං 1996, 16 පිටුව). ගැටුම් කළමනාකරණ පර්යේෂණ පිළිබඳව මූලික විශ්ලේෂණාත්මක යොමු කිරීම් ආනුභවික සාක්ෂි මත පදනම් විය යුතු යයි ඔවුන් බල කරනු ඇත. එහි දී ගැටුම් කළමනාකරණය සම්බන්ධයෙන් ආරම්භයේ පටන් ම න්‍යායාත්මක දැනුවත්වීමක් ඇති වග පැහැදිලිවම සැලකිල්ලට නොගැනෙනු ඇත. ඒ අනුව ගැටුම් කළමනාකරණ ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මුලින් කර ඇති බොහෝ පර්යේෂණ, විශේෂයෙන්ම එංගලන්තය-ඇමෙරිකානු ප්‍රජාව තුළ කර ඇති ඒවා බෙහෙවින් යොමු වී ඇත්තේ තුන්වන පාර්ශව ක්‍රමෝපායයන්ගේ අපක්ෂපාත විශ්ලේෂණ සහ ක්‍රියාකාරීත්වය මත සහ ගැටුම්වල ස්වභාවය මතය.

ඒ හේතුවෙන්, අතීතයේ දී ගැටුම් කළමනාකරණ අභ්‍යාසය කෙතෙක් දුරට බෙහෙවින් නිර්දේශාත්මක වූ එහෙත් ප්‍රශ්න නොකෙරුණු උපකල්පන ගැන දැනුවත් වී පවතීදැයි නොසලකා එම අභ්‍යාසයට පැහැදිලි යථාර්ථය වෙත යොමුවීමට හැකියාව තිබුණි. මේවා සැලකිලිමත් වන්නේ, උදාහරණ වශයෙන්, තුන්වන පාර්ශවයේ සුජාත භාවය, බලය සහ මධ්‍යස්ථ බව මානව අවශ්‍යතාවල විශ්ව සහ ජාතික විශේෂත්වතා පාර්ශවයන් අතර අසමතුලිත බලය බෙදීයාම සහ ගැටුම් කළමනාකරණ ක්‍රියාවලියේ සාර්ථකත්වය සහ අපක්ෂපාතී භාවය ගැනයි.

න්‍යායය ආනුභවික මෙවලමක් සේ සලකනු ලබන විට ගැටුම් කළමනාකරණය සඳහා වන බොහෝ න්‍යායාත්මක හෝ සංකල්පීය ප්‍රවේශ ප්‍රශ්න විසඳීමේ ප්‍රවේශ බවට පත්වේ: ඒවා ක්‍රියාත්මක වන්නේ ආයතන සහ සමාජ සම්බන්ධතාවන්හි හඳුනා ගෙන ඇති ප්‍රබල ප්‍රමුඛ ආකෘතියක් තුළ ය. අර්ථ දැක්වීම අනුව ප්‍රශ්න විසඳීමේ ප්‍රවේශය "…. ලෝකය තිබෙන ආකාරයෙන් පිළිගනුයේ ඒකාබද්ධව සංවිධානය වී ඇති, පවත්නා සමාජ සහ බලය පිළිබඳ සම්බන්ධතා සහ ආයතනවල ක්‍රියාකාරීත්වය සඳහා වූ ආකෘතියක් වශයෙනි" (කොක්ස් 1998). මෙය බර්ටන්ගේ ගැටලු විසඳීමේ වැඩමුළු යාන්ත්‍රණයෙන් ගම්‍ය වනවාට වඩා බොහෝ සේ වෙනස් වූ ආකාරයක ප්‍රශ්න විසඳීමේ ක්‍රියාවක් බව සැලකිය යුතු වේ.

ප්‍රශ්න විසඳීමේ ප්‍රවේශය එයින් අපේක්ෂා කරනු ලබන යම් ආකෘතීන් කෙරෙහි විචාරාත්මක විමංසනයට අසමත් වන බව පැහැදිලි සේ පෙනී යයි. මෙය විශේෂයෙන්ම සමාජ රටාව සහ ස්ථිති සංරක්ෂණය, ස්ත්‍රී පුරුෂභාවය හෝ සාර්වත්‍රික බව සහ විෂයීයත්වය පිළිබඳ එහි උපකල්පනයන් ප්‍රශ්න කිරීම සඳහා අදාළ වෙයි. සමහරවිට මෙයින් ගැටලු නිරාකරණය පිළිබඳ සංකල්පීය හා විවරණාත්මක ආකෘති, සමාජ සාධාරණත්වය පිළිබඳ සංකල්ප හෙවත් ධනාත්මක හා ඍණාත්මක සාමය පිළිබඳ සංකල්ප ප්‍රකට හා අප්‍රකට ගිවිසුම් තුළ ක්‍රියාත්මක වන්නේ මන්දැයි පැහැදිලි කරනු ඇත (විලියම් සාර්ට්මන් 1996, පිටු 79-98 බලන්න). බුෂ් සහ ෆොල්ගර් ඔවුන්ගේ විශ්ලේෂණය දේශීය ගැටුම් නිරාකරණය පිළිබඳව කේන්ද්‍රගත වන අතර (මෙහි විශේෂයෙන්ම එක්සත් ජනපදයේ ADR හි සංවර්ධනය පිළිබඳව) ඔවුහු ගැටුම් කළමනාකරණ සාර්ථකත්වය තක්සේරු කිරීම පිළිබඳ තවදුරටත් සාකච්ඡා කිරීම සඳහා පොළඹවනසුලු ප්‍රශ්න ඉදිරිපත් කරති (බුෂ් සහ ෆෝල්ගර් 1994 බලන්න). සමහර ගැටුම් කළමනාකරණ ප්‍රයත්නයන් ඵලදායී බවට සමහර විද්වතුන් සහ වෘත්තිකයන් සලකන්නේ ඵලදායී යන්නෙන් ඇත්ත වශයෙන්ම අදහස් වන්නේ කුමක්දැයි නියම අන්දමින් නිර්වචනය කිරීමකින් තොරවය.

උදාහරණයක් වශයෙන්, සමස්තයක් වශයෙන් එදිරිවාදිකම් සහ ප්‍රචණ්ඩත්වය අඩු කිරීම, හෝ සටන් විරාමයක් ස්ථාපිත කිරීම ඵලදායී ගැටුම් කළමනාකරණයක්ද?

බොහෝ ගැටුම් කළමනාකරණ පර්යේෂණ ප්‍රයත්නවල විශේෂ දෙයක් වන්නේ ගැටුම් කළමනාකරණ සාර්ථකත්වයක් යථා පරිදි අවබෝධ කර ගැනීම හා ඇගයුම සඳහා අත්‍යවශ්‍ය වන කුමන ආකාරයක හෝ පැහැදිලි ආදර්ශවත් න්‍යායාත්මක මූලික පුහුණුවක් හෝ අත්දැකීමක් දක්නට නොලැබීමයි (ක්ලෙයිබෝ 1996, 377 පිටුව සහ 1998 බලන්න). ඒ අනුව රස්මුසෙන්, රොව්භානා සහ රොත්මන් අවධාරණය කර ඇත්තේ බොහෝ ඇගැයීම් දුර්වල ආකාරයෙන් මෙහෙයවා හෝ සම්පූර්ණයෙන් ඉවත් කොට ඇති බවයි. මෙයට ප්‍රධාන හේතුව වී ඇත්තේ "මැදිහත්වීමක් ගොඩනගා ඇති න්‍යායාත්මක පදනම පැහැදිලි කර නොමැතිවීමයි" (ෆෝල්ගර් 1999). ගැටුම් කළමනාකරණය නම් වූ යාත්‍රාව පැද්දීමට තරම් අප නිර්භීත විය යුතුය. ඇත්ත වශයෙන්ම, විශ්ලේෂණ සියල්ල දක්වා ලන නමුත් කිසි විටෙකත් විස්තර ඉදිරිපත් නොකෙරෙන හෝ ප්‍රශ්න කිරීමට භාජන නොවන මෙම අනුල්ලංඝනීය සහ අභාෂිත වූ අගයන් කවරේද?

එවැනි අනුල්ලංඝනීය අගයන් පිළිබඳ හොඳ උදාහරණයක් ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ ගැටලුව ඇසුරින් ලබාගත හැකිය. ගැටුම් කළමනාකරණ ක්ෂේත්‍රයෙහි පුද්ගලයා පිළිබඳව විශාල වශයෙන් ගම්‍ය වන අපගේ ප්‍රතිරූපය කුමක්ද? අප ඔහු හෝ ඇය දකින්නේ තාර්කික එමෙන්ම සහානුභූතික සහ සහයෝගයට නැඹුරු වූ ස්ත්‍රී පුරුෂ වශයෙන් මධ්‍යස්ථ වූ කෙනෙකු හැටියට ද? වෙන කිසිවක් තබා, ගැටුම් කළමනාකරණ න්‍යාය සහ අභ්‍යාසය ස්ත්‍රී පුරුෂ සමාජභාවයෙන් පරිබාහිර ව්‍යවසායක් ලෙස නිරූපණය ගැන ගැටුම් කළමනාකරණ විද්වතුන් සාධාරණ ලක්වීමට ඉඩ තිබේ; සැමවිටම ඔවුන්ගේ කාර්ය-බද්ධ උපකල්පනය වී ඇත්තේ ගැටුම් කළමනාකරණය යුද්ධය සහ සාමය පවතින කාල සීමාවල දී සාපේක්ෂ තරාතිරම් කෙරෙහි හෝ සමාජයේ ස්ත්‍රීන් සහ පුරුෂයින්ගේ කාර්යභාරයන් කෙරෙහි විද්‍යමාන බලපෑමක් නොකරන බවයි.

දිග්ගැසුනා වූ ගැටුම් විශ්ලේෂණය සහ කළමනාකරණය මගින් විශේෂයෙන්ම කාන්තා සහ 'අවප්‍රමාණිත පිරිමි' (වර්ණ භේදයෙන් පීඩිත වූ අය, බටහිර පන්නයට හැඩ නොගැසුණු අය, කම්කරු පන්තිය හෝ සමලිංගික අය) සහ ඔවුන්ගේ සමාජ අපේක්ෂා, අදහස් සහ පළපුරුද්ද ගැන කිසිම තැකීමක් නොකර අත්හැර දමා ඇත (රෙයිමාන් 2001 බලන්න). ගැටුම් කළමනාකරණ සාහිත්‍යය දෙස උඩින් පල්ලෙන් බැලුවහොත් ක්ෂණිකවම පෙනී යන්නේ ගැටුම් කළමනාකරණය සංකල්පීය සහ විශේෂයෙන්ම ප්‍රායෝගික තලයේ දී රඳා පවතින්නේ පුරුෂවාදී ලෝකයකයි. ගෘහස්ථ සහ දේශීය ගැටුම් පිළිබඳ කටයුතුවල නියැලී සිටින අය මෙන් නොව ජාත්‍යන්තර භූමිකාවේ ගැටුම් කළමනාකරණ අභ්‍යාසයෙහි යෙදී සිටින අය සහ විද්වතුන් වැඩි දෙනා තවමත් පුරුෂ පක්ෂයෙන් වීමයි.

මෙම ගැටුම් කළමනාකරණ ක්ෂේත්‍රය බොහෝ පුරුෂාධිපත්‍ය සමාජවල දැකගත හැකි කේවල බල ව්‍යුහයන් සහ ධුරාවලින් ඇත්ත වශයෙන්ම අඛණ්ඩව පවත්වාගෙන යන බව හා වක්‍ර අන්දමින් බලගන්වන බව ඒත්තු ගන්වමින් ස්ත්‍රීවාදීන්ට තර්ක කළ හැකිය. ලිංගික අසමානතාව හේතු කොට ගෙන පැන නගින සමාජ ගැටුම් අඩු කිරීමට හෝ යටපත් කිරීමට බොහෝ තුන්වන පාර්ශවයේ මැදිහත්වීම් බෙහෙවින් යොමු වෙයි. මේ දෘෂ්ටිකෝණයේ පිහිටා යමෙකුට මෙසේ ප්‍රශ්න කළ හැකිය:

බැටලු හම පොරවාගත් වෘකයෙක් සිටිනවා ද? ගැටුම් කළමනාකරණය සංකේත වෙනස් කරන නමුත්, ඒ අතරම "නව" පශ්චාත් සමථකරණ රටාව තුළ පුරුෂාධිපත්‍යයේ "පැරණි" අදෘශ්‍ය ප්‍රතිපත්ති සහ අභ්‍යාසයන්ට දිගටම දායක වනවාද? මේ ආකාරයෙන් ගැටුම් කළමනාකරණය, කළමනාකරණය පිළිබඳ තර්ක සහ අභ්‍යාස නමැති ගොහොරුවේ ගැලී පවතී. ඒ හේතු කොට ගෙන ලිංගික අසමානතාව වැනි ගැටුම් කළමනාකරණය සම්බන්ධ ආරම්භක උනන්දුවීම්වල දී ලිංගික අසමානතාවට පසුබිම් වන බව සංයුතිය වැනි කරුණු නොතකා හැරේ.

මෙය සෘජුවම වඩාත් පුළුල් ප්‍රශ්න මතු කරයි: ගැටුම් කළමනාකරණය සමාජභාවය සම්බන්ධයෙන් මධ්‍යස්ථ නොවන්නේ නම් ගැටුම් කළමනාකරණ ප්‍රවේශයන්හි පොදු හා පෞද්ගලික ක්ෂේත්‍රයන් සම්බන්ධ එහි සැඟවුණු වැටහීම් කෙබන්දක් ද? සමාජභාවී - සමථකරු හෝ ගැටුම් කළමනාකරණ විද්වතා යනුවෙන් ප්‍රතිමූර්ති වන්නා යන්නෙන් තේරුම්ගත යුත්තේ කුමක් ද? එනම්, ගැටුම් කළමනාකරණ අභ්‍යාසය පුරුෂයා හා ස්ත්‍රිය නිර්වචනය කරන්නේ කෙසේ ද? ව්‍යතිරේක වශයෙන්, ගැටුම් කළමනාකරණ න්‍යායයේ සහ අභ්‍යාසයේ දී පුරුෂත්වය සහ ස්ත්‍රීත්වය පිළිබඳ පාදක වූ අවබෝධය කුමක්ද?

විශ්ලේෂණය පෙන්නුම් කරන්නේ බොහෝ ගැටුම් කළමනාකරණ ප්‍රවේශ අනන්‍යතාව පිළිබඳ සාමාන්‍යයෙන් ස්ථිතික සහ සරල මතයක් අනුව ක්‍රියා කරන බවයි. බර්ටන් කුමක් කීවත්, කල්පවතින්නා වූ සහ පාලනය කර ගැනීමට දුෂ්කර සමාජ ගැටුම් පිළිබඳ අධ්‍යයනයේදී විශ්ලේෂණය සඳහා අනන්‍යතා කණ්ඩායම වඩාත් උචිත ඒකකය හැටියට අසාර් සහ වෙනත් අයවලුන් විසින් සලකනු ලබන්නේ වුවද අනන්‍යතා විස්ථාපනය සහ සංස්කරණය වන විපුල සහ විවිධ ආකාරයන් පිළිබඳව ඔවුන්ගේ ලියකියවිලි අඩුපාඩුවලින් ගහණ වන අතර, ඒවා ප්‍රමාණවත් ලෙස පැහැදිලි කිරීමට ද අසමත් වේ. පුරුෂත්වය සහ ස්ත්‍රීත්වය පිළිබඳ මත සහ බොහෝ ගැටුම්වලදී ප්‍රචණ්ඩත්වයට හෝ සාමයට ඒවායේ ඇති සම්බන්ධතාව අස්ථිර බවත් නිරන්තරයෙන් ප්‍රති-නිර්වචනය සහ සාවධානව මෙහෙයවිය යුතු බවත් අවබෝධ කර ගැනීම ඉතා වැදගත් වේ.

ගැටුම් කළමනාකරණයේ සාර්ථකත්වය නිර්වචනය කිරීමට ප්‍රයෝජනවත් වන්නේ බොහෝ විට විද්වතුන්ගේ වෘත්තිකයන්ගේ අප්‍රකාශිත සහ සැඟවුණු ඇගැයීම් බව මෙම ප්‍රශ්න මඟින් ඉස්මතු කර දැක්වීමට හැකි වේ. මේ ආකාරයෙන් බලන කල, උදාහරණයක් වශයෙන්, ගැටුම් කළමනාකරණයේ ඵලදායී ප්‍රතිඵල පිළිබඳ සංකල්පය පෙන්නුම් කරන්නේ එය විෂයමූලක ප්‍රකාශනයකට වඩා අතිශයින් ආත්මීය, අගයක් ගත් සංස්ථිතියක් බවයි. ගැටුම් කළමනාකරණ ප්‍රයත්නයක් සාර්ථක එකක් වශයෙන් නම් කිරීමට ගුණාගුණ විනිශ්චය කිරීමක් වෙයි.

ගැටුම් කළමනාකරණ ප්‍රයත්නයන්ගේ සාර්ථකත්වය ක්‍රමානුකූලව වර්ගීකරණය කිරීම සහ ඇගැයීම සඳහා වූ සංකල්පීය පාදක ව්‍යුහයක ආකාරයෙන් විසඳුමක් ඉදිරිපත් කිරීමට සාමය සහ ගැටුම්වල බලපෑම තක්සේරු කිරීම (PCIA) පිළිබඳව කෙරී ගෙන යන සාකච්ඡාව තුළින් කෙතරම් දුරට හැකිවේද යන්න ඉදිරියේ දී දක බලාගත හැකිය (මෙම වෙළුමෙහි මාක් හොෆ්මන්ගේ ලිපිය බලන්න). ඇගැයීම් ආකෘති පත්‍රවල එන ජයග්‍රහණ මිම් පෙන්නුම් කරන අතිශයින් ජනප්‍රිය සහ පිරිසිදු කොටු අවසානයේදී න්‍යාය පිපාසිත සයුරක බින්දු කිහිපයක් පමණක් නොවන්නේදැයි විවේචකයන් ප්‍රශ්න කරන්නට ඉඩ ඇත.

බොහෝ අන්තර් කණ්ඩායම් ගැටුම් තුළ ආවේණික, එහෙත් බලාපොරොත්තු නොවූ, අතිශයින් සංකීර්ණ සහ ගතික වූ ගැටුම් අන්තර්-ක්‍රියාකාරීත්වයන් පිළිබඳ සමස්ත චිත්‍රයක් තුළට, මගේ අදහස් අනුව, පදනම් රහිත කේවල සහ ස්ථිතික ගැටුම් දර්ශක කෙතරම් දුරට අත්දැකීම් එකතු කරන්නේ ද යනුවෙන් තවදුරටත් ප්‍රශ්න කිරීමට යමෙකුට ඉඩ තිබේ. නිදසුන් වශයෙන් කෙනෙකු වෙනස්වන, සංකීර්ණ වූ කාන්තා අනන්‍යතා සහ නියෝජිත ආයතන සාර්ථකත්වයට හෙවත් ගැටුම් දර්ශකයකට ගළපා ගත හැකි පරිදි ජීවය ලබාදිය යුත්තේ කෙසේද?

බොහෝ කාන්තාවන්ට රාජ්‍ය අභ්‍යන්තර ගැටුම් අත්විඳීමට සිදුවිය හැක්කේ තරමක් ව්‍යාකූල නොපැහැදිලි ආකාරයකටය. මුලින් පුරුෂයන්ගේ ආධිපත්‍ය යටතේ පැවැති පොදු හා පෞද්ගලික ක්ෂේත්‍රයන්හි කාර්යභාරයන්ට සාර්ථකව හුරු වූවාක් මෙන් සමහර ප්‍රචණ්ඩ ගැටුම් ඇත්ත වශයෙන්ම කාන්තාවන්ගේ බලගැන්වීම සඳහා ක්ෂණික උත්ප්‍රේරණයක් වශයෙන් දැක්විය හැකි වෙයි. කෙසේ වුවද, ඔවුන් සම්බන්ධයෙන් ගත් කල බොහෝ ගැටුම් පවතින්නේ මූලික වශයෙන් ම විනාශකාරී අත්දැකීම් වශයෙනි; ඒවායේ විශේෂ ලක්ෂණ වන්නේ බරපතළ ම්ලේච්ඡ ක්‍රියා සහ ලිංගික ප්‍රචණ්ඩත්වය, ලිංගික දූෂණය සහ බලහත්කාරයෙන් වෛශ්‍යා වෘත්තියේ යෙදවීම වැනි මහා පරිමාණයේ මානව හිමිකම් උල්ලංඝනය කිරීමය. මේ නිසා ප්‍රචණ්ඩ ගැටුම් තුළ කාන්තා නියෝජන ක්‍රියාවලියේ කළමනාකරණය සාකච්ඡා කරන විට යමකු නිරන්තරයෙන්ම සිත තබාගත යුතු කරුණක් වන්නේ එක් අතකින් අවදානම සහ බිලිවීම අතර සහ අනික් අතට බලගැන්වීම සහ විමුක්තිය අතර ඇති වික්ෂිප්ත ආතතියයි. මෙහි දී එකක් පරයා අනෙකට ප්‍රමුඛත්වය ලබාදීමේ ආවේගය නිරතුරුව මැඩ පවත්වා ගැනීමේ ප්‍රවණතාවක් වෙයි (රෙයිමන් 2001 බලන්න).

සාමාන්‍යයෙන් වෙනස් සහ විවිධාකාර ගැටුම් දර්ශක මගින් වර්ගීකරණය කර ඇති සිදුවීම් පෙළක් ගැන කෙනෙකුට අනුමාන කළ හැකි වුවත් බොහෝ වර්තමාන ගැටුම්වල තිබෙන ආකාරයේ ලක්ෂණවලින් හෙබි පද්ධතිමය සමාජ-අභ්‍යන්තර ප්‍රචණ්ඩත්වයේ ගතිකත්ව පිළිබඳ සතුටුදායක පැහැදිලි කිරීමක් කෙනෙකුට සොයාගත නොහැකිය. එසේ නම් සාමය සහ ගැටුම්වල බලපෑම තක්සේරු කිරීම (PCIA) පිළිබඳ දේශපාලන සහ සදාචාරමය ඇඟවීම් කවරේද?

බොහෝ සාමය සහ ගැටුම්වල බලපෑම තක්සේරු කිරීම් (PCIA) ප්‍රතිඵල ගැන ක්‍රියා කළ යුත්තේ කෙසේද යන්න ගැන ලබාදෙන්නේ සීමිත දේශපාලන සහ ආචාර විද්‍යාත්මක මග පෙන්වීමකි. මෙය පුදුම විය යුතු කරුණක් නොවන්නේ මේ දක්වා යෝජනා කර ඇති ජයග්‍රහණ හෝ ගැටුම් දර්ශක සාමකාමී සහ යුක්තිගරුක සමාජයක් තුළ පුළුල් න්‍යායාත්මක රාමුවක් මත පිහිටා නොතිබීමයි. සාමය සහ ගැටුම්වල බලපෑම තක්සේරු කිරීම් මගින් සංවර්ධන සහයෝගිතා ව්‍යාපෘතිවල ආර්ථික කාර්යක්ෂමතාවක් පෝෂණය ඇති කිරීම පැහැදිලි විය හැකි නමුත් මේ දක්වා එය සාමය ගොඩනැගීමේ ප්‍රයත්නයන් සාර්ථක හෝ අසාර්ථක වශයෙන් හඳුන්වමින් සදාචාරාත්මක සහ දේශපාලන භූමිකාවට ප්‍රවේශවීමට තරම් මුහුකුරා ගොස් නැත.

ප්‍රශ්න විසඳීමේ ප්‍රවේශයන්හි අඩුපාඩු තරමක් දීර්ඝ වශයෙන් සලකා බැලීමට සහ සාකච්ඡා කිරීමට තරම් මෙම ක්ෂේත්‍රයෙහි සිටි කීප දෙනාගෙන් නිර්භීත වූ එක් අයෙක් නම් බර්ටන්ය. (ඒ වෙනුවට බර්ටන් කතා කරන්නේ "ප්‍රහේලිකා විසඳීමේ ප්‍රවේශ" ගැනය) බර්ටන්ගේ ප්‍රවේශය පරිදි "…. විසඳුම යනු

අවසාන නිමි භාණ්ඩය නොවේ. එය ද එයටම ආවේණික වූ ගැටලුවලින් සමන්විත සම්බන්ධතා කට්ටලයකි... ගැටලු විසඳීමේ කාර්යයේදී බොහෝ විට අවශ්‍ය වන්නේ අවබෝධයේ සහ ක්‍රමවේදයන්හි සංශ්ලේෂණයක් සහ න්‍යායාත්මක ව්‍යුහයේ වෙනසකි. අන්තර්-ක්‍රියා පද්ධතිය විවෘත එකකි; එනම් අදාළ කොටස් අන්තර් ක්‍රියාකාරීත්වයකට යටත් වනවා පමණක් නොව, සීමාවක් නොමැති පුළුල් පරිසරයක් සමග අන්තර්-ක්‍රියාකාරීත්වයකට යොමු වේ (බර්ටන් 1979).

මෙම ප්‍රවේශය තුළ, බැලූ බැල්මට පෙනෙන පරිදි න්‍යායාත්මක - ප්‍රතිමානක ඇගයුමක් කිරීම් වශයෙන් විචාර න්‍යායය ගැන කිසියම් පිළිගත හැකි සේ හැඟෙන ග්‍රහණයක් මෙම ප්‍රවේශයට ගැබ් වී තිබේ. බර්ටන් මෙන් විචාර න්‍යාය යොමුවන්නේ ප්‍රශ්න විසඳීමේ සාම්ප්‍රදායික ප්‍රවේශ විධි අභියෝගයට ලක් කිරීමට සහ ඒවා කඩා බිඳ දැමීමටය. එසේ කරනු ලබන්නේ "සමාජ ජීවිත නිදහස අවුරා සිටින පැලපදියම් වූ ස්වරූප" ගැන ප්‍රශ්න කරමිනි (දෙවෙතක් 1996, 148 පිටුව). මෙහි ආරම්භක ස්ථානය වන්නේ, බර්ටන් සම්බන්ධයෙන් මෙන්, ආයතනික සහ සමාජ සම්බන්ධතා ගැන ඉදිරිපත් කරනු ලබන ඕනෑම ආකෘතියක ආරම්භය විසඳුමක් පතන ගැටලුවක් කර ගැනීමයි. එසේම බර්ටන්ගේ ගැටලු විසඳීමේ ප්‍රවේශය මෙන් විචාර න්‍යායය ද සමාජ වෙනසක් ගෙන ආ හැකි මාර්ග පැහැදිලි කිරීමට බලාපොරොත්තු වෙයි, ඒ මඟින් බලවත්ව තිබෙන්නා වූ සමාජ සහ දේශපාලන පද්ධතිය ව්‍යාවර්තනය කිරීමට ද බලාපොරොත්තු වෙයි (කොක්ස් 1981, 129-130 පිටු බලන්න).

තවත් කුතුහලය දනවන ප්‍රශ්නයක් වන්නේ, බර්ටන්ගේ ගැටලු විසඳීමේ වැඩමුළුව කොතරම් දුරට හබර්මාස්ගේ 'පරමාදර්ශී භාෂණ අවස්ථාව' පිළිබිඹු කරන්නේ ද යන්නයි. හබර්මාස්ගේ පරමාදර්ශී භාෂණ අවස්ථාවට අනුව සහභාගිවන සියලු දෙනාටම සහභාගිවීමටත්, ප්‍රශ්න ඇසීමටත් සමාන අවස්ථාවක් ඇත. අවසාන වශයෙන් බර්ටන්ට සමානව යමින්, හොර්ක්-හයිමර් අවධාරණය කරන්නේ දැනුම යනු සංයුක්ත ඓතිහාසික තත්ත්වයක පරාවර්තනයක් පමණක් නොව, එය සමාජ වෙනස උත්පාදනය කරනු ලබන සමාජ බලවේගයක් ලෙස අවබෝධ කරගත යුතුය (හොරක්-හයිමර් 1972, 215 පිටුව බලන්න).

එසේ වුවද, බර්ටන්ගේ ඉන්ද්‍රියානුභූතිවාදයට එරෙහි තර්කන ක්‍රමය කෙසේ හෝ ඔහුගේ ගැටුම පිළිබඳ විද්‍යාත්මක අධ්‍යයනය සඳහා වූ ඉන්ද්‍රියානුභූතිවාදී ප්‍රවේශය කෙරෙහි පුළුල් අවධාරණය සමග ගැටෙයි: බර්ටන්ගේ බොහෝ ලියකියවිලි කිසියම් ආකාරයකින් හෝ පිළිබිඹු කරන්නේ පොදුවේ ඔහු විසින් ගවේෂණය කරනු ලබන සමාජ රටාව පිළිබඳ මතවාද වියුක්ත වූ ආකෘතියක් සහ විශේෂයෙන්ම විෂයමූලක මානව අවශ්‍යතා පිළිබඳ අගය රහිත සංකල්පයකි. වෙනත් වචනවලින් පවසන්නේ නම් " ආත්මමූලිකත්වයේ සිට න්‍යායය පදනම් කරගත් විෂයමූලිකත්වය" දක්වාම යාම සම්බන්ධයෙන් වූ බර්ටන්ගේ ආප්තය පත් වී ඇත්තේ "නොගැලපෙන තත්ත්වයකටය. එය එසේ වීමට හේතු වූයේ සමාජයීය ලෝකය පිළිබඳව කෙරෙන ඕනෑම විශ්ලේෂණයක් එම කාර්යයෙහි යෙදී සිටින විශ්ලේෂකයාගේ ඇගයුම්වලින් සමන්විත වීමයි. තරගකාරී අගයන් පවතින ලෝකයක, ඕනෑම විශේෂිත ආකෘතියක තිබෙන ප්‍රශස්ත බව ඒ අනුව, ස්වයං සිද්ධ වූවක් නොවේ. මතවාද විරහිත කිසිදු ආදර්ශයක් නැත. ජෝන් බර්ටන් හට ලෝකය වෙනස් කිරීමට අවශ්‍ය වී ඇති බැවින් මතවාදවලට අදාළ කොන්දේසිවල වෙනසක් ඇති කිරීම හැර වෙනත් විකල්පයක් ඔහුට නොමැත. කිසිවෙකුගේ අගයන් ස්වභාව විද්‍යාවේ

සළු පිළිවලින් සැරසීම ප්‍රතිවිරුද්ධ ප්‍රතිඵල ගෙනදෙයි. සමාජ රටාවේ මතවාද විරහිත ආකෘතියක් යනු මායාවක් වන හෙයින් එයට හිමිකම් කීම හෝ හඹායාම අනුවණකමකි (ලිට්ල් 1984, 95 පිටුව).

5. පවත්නා ප්‍රශ්න සහ අභියෝග

මෙම පරිච්ඡේදයෙන් පැහැදිලි කර දීමට බලාපොරොත්තු වී ඇත්තේ තවමත් ප්‍රබල තත්ත්වයක තිබෙන එංගලන්ත - ඇමෙරිකානු අනුභූතිවාදී ක්‍රමවේදය බර්ටන් සහ බර්කෝවිච් ඉදිරිපත් කර ඇති ආකාරයට විද්‍යාත්මක විධි සමග ප්‍රතිපත්තියට නැඹුරු වූ විනිශ්චයන් එකිනෙකට සම්බන්ධ කිරීමට අපේක්ෂා කරන අතර එය හේතු ඵලවාදී සාම්ප්‍රදායික විද්‍යාත්මක න්‍යායන්ගෙන් අතිවිශාල අන්දමින් ආභාසය ලබන බවයි. මේ අනුව කරුණ සහ අගය අතර සමාජ විද්‍යාවේ බොහෝ සේ පවතින බෙදුම සාමාන්‍යයෙන් සිදුවන්නක් සේ සහ කෙසේ හෝ වැළැක්විය නොහැකි දෙයක් සේ පිළිගෙන ඇති අතර, ගැටුම් කළමනාකරණය සම්බන්ධයෙන් වූ බොහෝ පර්යේෂණවලින් පෙනෙන අන්දමට කරුණු සහ අගයන් අතර වෙනස් කළ නොහැකි භේදය අභියෝගයට ලක් නොවේ.

නැවත මෙයින් පැහැදිලි කරදෙනු ලබන්නේ බොහෝ ගැටුම් කළමනාකරණ පර්යේෂණයන්හි ද්විභේදී අදහස් බහුලව තිබීමට හේතුවයි. ගැටුම් කළමනාකරණ සාහිත්‍යය පිළිබඳ මෙම කෙටි සමාලෝචනය යෝජනා කරන්නේ බොහෝ පර්යේෂණ බොහෝ කලක් තිස්සේ අවාසනාවකට මෙන් පදනම් කරගෙන ඇත්තේ සාවද්‍ය වූ ද්විභේදී මත යි. එබඳු ද්විභේදන අතර විෂය මූලිකව සහ ආත්මමූලකත්වය අතර ඇති ද්විභේදනය, එමෙන්ම ගැටුම් බේරුම්කරණ සහ ගැටුම් නිරාකරණ ක්‍රමෝපායයන් අතර ඇති ද්විභෙදනය සහ අපක්ෂපාතී බව සහ පක්ෂපාතී බව අතර ඇති ද්විභේදයයි (බෙකට් 1997 ද බලන්න).

ගැටුම් කළමනාකරණ සහ ගැටුම් ව්‍යාවර්තන ක්ෂේත්‍රයට සමාජ සහ දේශපාලන න්‍යායය පිළිබඳ පුළුල් සංවාදයන්ට විවෘත වීමේ සැබෑ උවමනාවක් ඇත. එහිදී විශේෂයෙන් ම බලාපොරොත්තු වන්නේ ද්විභේදී චින්තන සහ න්‍යායාත්මක සලකා බැලීම එක් කිරීමට උත්සාහ කරනු ලබන ප්‍රවේශයන් යා කිරීමටය. එසේ යා කරනු ලබන්නේ ස්ත්‍රී වාදය, විචාර න්‍යායය සහ සමාජයීය නිර්මාණවාදය ආදියෙන් උකහා ගන්නා අන්තර්ඥානය ප්‍රයෝජනයට ගනිමිනි. ගැටුම් කළමනාකරණය සම්බන්ධයෙන් වඩාත් ලිංගිකත්ව - සංවේදී ප්‍රවේශයකින් ලබාගැනීමට ඉඩ ඇති සාර්ථකත්වය පිළිබඳ සාකච්ඡාවක් සඳහා (රෙයිමන් 2001 බලන්න) ගැටුම් කළමනාකරණයේ සහ ව්‍යාවර්තනයේ අභ්‍යන්තර සහ බාහිර ක්ෂේත්‍රයන් දෙකම පිළිබඳ තවදුරටත් සාකච්ඡා කළහොත් පැහැදිලි වන්නේ සමාජ සහ දේශපාලන න්‍යාය පිළිබඳ පුළුල් සංවාද කෙතරම් දුරට සමස්ත ක්ෂේත්‍රයටම වැදගත් නව මංපෙත් සහ පදනම් දැමීමෙන් දායකවීම ආරම්භ කර ඇති බවයි.

6. ආශ්‍රිත ග්‍රන්ථ සහ වැඩිදුර කියවීම් සඳහා

Azar, Edward E. 1990. *The Management of Protracted Social Conflict*, Hampshire: Dartmouth.

Banks, Michael (ed.) 1984. *Conflict in World Society: A New Perspective on International Relations*, Brighton: Wheatsheaf.

Banks, Michael and Christopher R. Mitchell 1991. *A Handbook of the Analytical Problemsolving Approach*, Fairfax, Va: Institute for Conflict Analysis and Resolution.

Beckett, Gavin 1997. "Social Theory and the Theory and Practice of Conflict Resolution.", *in* Broadhead, op.cit., 59–86.

Bennett, D. Scott 1996. "Security, Bargaining and the End of Interstate Rivalry," *International Studies Quarterly*, 40, 2: 157–184.

Bercovitch, Jacob 1992. "The Structure and Diversity of Mediation in International Relations", *in* Bercovitch and Rubin, op. cit., 10–21.

Bercovitch, Jacob 1984. *Social Conflicts and Third Parties: Strategies of Conflict Resolution*, Boulder, Co: Westview.

Bercovitch, Jacob (ed.) 1996. *Resolving International Conflicts: The Theory and Practice of Mediation*, Boulder, Co: Lynne Rienner.

Bercovitch, Jacob 1997. "Mediation in International Conflict," *in* Zartman and Rasmussen, op. cit., 133.

Bercovitch, Jacob and Jeffrey Rubin (eds.) 1992. *Mediation in International Relations. Multiple Approaches to Conflict Management*, London: St. Martin’s Press.

Bercovitch, Jacob and R. Wells 1993. "Evaluating Mediation Strategies: A Theoretical and Empirical Analysis", *Peace and Change*, 18, 3–25.

Bloomfield, David 1997. P*eacemaking Strategies in Northern Ireland: Building Complementarity in Conflict Management Theory,* New York: St. Martin's Press.

Bomers, Gerald B.J. and Richard B. Peterson (eds.) 1982. *Conflict Management and Industrial Relations*, Boston, The Hague and London: Kluwer/Nijhoff Publishing.

Brams, S.J. 1990. *Negotiation Games: Applying Game Theory to Bargaining and Arbitration,* New York: Routledge.

Broadhead, Lee-Anne (ed.) 1997. *Issues in Peace Research 1997–98*, Bradford: Department of Peace Studies, University of Bradford.

Burchill, Scott and Andrew Linklater (eds.) 1996. *Theories of International Relations*, London: Macmillan Press.

Burton, John 1968. *Systems, States, Diplomacy and Rules*, Cambridge: Cambridge University Press.

Burton, John 1969. *Conflict and Communication: The Use of Controlled Communication in International Relations*, London: Macmillan.

Burton, John 1972. *World Society*, London: Macmillan.

Burton, John 1979. *Deviance, Terrorism and War: The Process of Solving Unsolved Social and Political Problems,* Oxford: Martin Robertson Press.

Burton, John 1987. *Resolving Deep-Rooted Conflicts: A Handbook*, Lanham, Md: University Press of America.

Burton, John (ed.) 1990. *Conflict: Human Needs Theory*, London: Macmillan.

Burton, John 1993. "Conflict Resolution as a Political Philosophy", *in* Sandole and van der Merwe, op. cit.

Burton, John and Frank Dukes (eds.) 1990. *Conflict: Readings in Management and Resolution*, London: Macmillan.

Bush, R. A. Baruch and Joe Folger 1994. *The Promise of Mediation: Responding to Conflict Through Empowerment and Recognition*, San Francisco: Jossey-Bass.

Charles Stewart Mott Foundation 1999. *Reaching for Peace: Lessons Learned from Mott Foundation´s Conflict Resolution Grantmaking, 1989-1998*, Evaluation conducted by CDR Associates and the Berghof Research Center for Constructive Conflict Management, Flint, Michigan: Charles Stewart Mott Foundation.

Clements, Kevin 1998. "A Field in Tension: From Alternative Dispute Resolution to Conflict Transformation," *in* Pressis and Fougere, op. cit., 129–148.

Corbin, Jane 1994. *The Norway Channel: The Secret Talks that Led to the Middle East Peace Accord*, New York: Atlantic Monthly Press.

Coser, Lewis A. 1956. *The Functions of Social Conflict*, New York: Free Press.

Cox, Robert W. 1981. "Social Forces, States and World Orders: Beyond International Relations Theory",

Millennium, 10, 2, 126–155.
Cox, Robert W. 1983. "Gramsci, Hegemony, and International Relations: An Essay in Method", *Millennium*, 12, 2, 162–175.
Curle, Adam 1971. *Making Peace*, London: Tavistock Publications.
Dahrendorf, Ralf 1957. "Towards a Theory of Social Conflict", *Journal of Conflict Resolution* 2, 2, 170–183.
Dahrendorf, Ralf 1994. *Der moderne soziale Konflikt. Essays zur Politik der Freiheit*, München: DTV.
Devetak, Richard 1996. "Critical Theory," *in* Burchill et. al., op. cit., 210–251.
Diamond, Louise and John McDonald 1996. *Multi-Track Diplomacy: A Systems Approach to Peace*, Washington, DC: Kumarian Press.
European Platform for Conflict Prevention and Transformation 1998. *Prevention and Management of Violent Conflicts. An International Directory*, Utrecht: European Platform for Conflict Prevention and Transformation (in cooperation with PIOOM and the Berghof Research Center for Constructive Conflict Management).
European Centre for Conflict Prevention 1999 *People Building Peace: 35 Inspiring Stories from around the World*, Utrecht: European Centre for Conflict Prevention (in co-operation with the International Fellowship of Reconciliation (IFOR) and the Coexistence Initiative of State of the World Forum).
Featherstone, A. Betts 1991. "The Problem-Solving Workshop *in* Conflict Resolution," in Woodhouse, op. cit., 252–255.
Fetherston, A. Betts 2000. *From Conflict Resolution to Transformative Peacebuilding: Reflections from Croatia. Working Paper 4 (April)*, Bradford: University of Bradford.
Fetherston, A. Betts and A. C. Parkin 1997. "Transforming Violent Conflict: Contributions from Social Theory." *in* Broadhead, op. cit., 19–57.

Fisher, Roger and W. Ury 1981. *Getting to Yes: How to Negotiate Without Giving In*, London: Arrow Books.
Fisher, Ronald J. 1972. "Third Party Consultation: A Method for the Study and Resolution of Conflict," *Journal of Conflict Resolution* 16, 1, 67-94.
Fisher, Ronald J. 1983. "Third Party Consultation as a Method of Conflict Resolution: A Review of Studies,"*Journal of Conflict Resolution* 27, 2, 301–334.
Fisher, Ronald J. 1997a. *Interactive Conflict Resolution*, Syracuse, NY: Syracuse University Press.
Fisher, Ronald J. 1997b. "Interactive Conflict Resolution," *in* I.W. Zartman & J.L. Rasmussen (eds.), op. cit., 239-272.
Fisher, Ronald J. and Loraleigh Keashly 1991. "The Potential Complementarity of Mediation and Consultation within a Contingency Model of Third Party Intervention," *Journal of Peace Research* 28, 1, 29–42.
Folger, Joseph P. 1999. "Evaluating Evaluation in Ethnic Conflict Resolution: Themes from, and Commentary on, the Haverford-Bryn Mawr Conference," *in* Ross and Rothman, op. cit., 214.
Folger, Joseph P. and Tricia S. Jones 1994. *New Directions in Mediation: Communication Research and Perspectives*, London: Sage Publications.
Galtung, Johan 1996. *Peace By Peaceful Means: Peace and Conflict, Development and Civilization*, London: Sage Publications and Oslo: PRIO.
Gandhi, M.K. 1938. *Hind Swaraj, or Indian Home Rule*, Ahmedabad: Navajivan Publishing House.
Gandhi, M.K. 1950. *Satyagraha in South Africa*, Ahmedabad: Navajivan Publishing House.
Glasl, Friedrich 1982. "The process of Conflict Escalation and Roles of Third Parties," in Bomers and Peterson, op. cit., 119–140.
Hill, Barbara 1982. "An Analysis of Conflict Resolution Techniques: From Problem-Solving Workshops to Theory," *Journal of Conflict Resolution* 26, 1, 109–138.
Horkheimer, Max 1972. *Critical Theory*, New York: Seabury Press.
Jabri, Vivienne 1990. *Mediating Conflict: Decision-Making and Western Intervention in Namibia*,

Manchester: Manchester University Press.
Jabri, Vivienne 1996. *Discourses on Violence: Conflict Analysis Reconsidered*, Manchester: Manchester University Press.
King, Martin Luther 1963. *Why We Can‘t Wait?*, New York: New American Library.
Kleiboer, Marieke 1996. "Understanding the Success and Failure of International Mediation," *Journal of Conflict Resolution* 40, 2, 360–389.
Kleiboer, Marieke 1998. *Multiple Realities of International Mediation*, Boulder, Co. and London: Rienner.
Lederach, John Paul 1995. *Preparing for Peace: Conflict Transformation Across Cultures*, New York: Syracuse University Press.
Lederach, John Paul 1997. *Building Peace. Sustainable Reconciliation in Divided Societies*, Washington, D.C.: United States Institute of Peace Press.
Lederach, John Paul 1999. "Justpeace: The Challenges of the 21st Century," *in* European Centre for Conflict Prevention 1999, op.cit.
Lewer, Nick 1999. *International Non-Governmental Organisations and Peacebuilding – Perspectives from Peace Studies and Conflict Resolution. Working Paper 3 (October)*, Bradford: University of Bradford.
Little, Richard 1984. "The Decision Maker and Social Order: The End of Ideology or the Pursuit of a Chimera?," *in* Banks, op. cit., 78–95.
McCarthy, Ronald M. and Gene Sharp 1997. *Nonviolent Action. A Research Guide*, New York and London:Garland Publishing, Inc.
Miall, Hugh 1992. *The Peacemakers: Peaceful Settlements of Disputes since 1945*, London: Macmillan.
Miall, Hugh, Oliver Rambotham, and Tom Woodhouse 1999. *Contemporary Conflict Resolution*, Cambridge: Polity Press.
Mitchell, Chris 1981. *The Structure of International Conflict*, London: Macmillan.
Mitchell, Chris 1991. "Recognising Conflict," *in* Woodhouse, op. cit.
Mitchell, Chris 1993. "Problem-solving Exercises and Theories," *in* Sandole and van der Merwe, op. cit., 83.
Moore, Christopher W. 1986. *The Mediation Process: Practical Strategies for Resolving Conflict*, San Francisco: Jossey-Bass.
Nicholson, Michael 1992. *Formal Theories in International Relations*, Cambridge: Cambridge University Press.
Prein, Hugo 1994. "A Contingency Approach for Conflict Intervention," *Group and Organisation Studies* 9, 1, 81–102.
Pressis, Rosemary du and Geoff Fougere (eds.) 1998. *Politics, Policy and Practice: Essays in Honour of Bill Willmott*, Christchurch, New Zealand: University of Canterbury.
Princen, Thomas 1992. *Intermediaries in International Conflict*, Princeton, NJ: Princeton University Press.
Reimann, Cordula 2001. "Engendering the Field of Conflict Management: Why Gender Does Not Matter! Thoughts from a Theoretical Perspective," *Peace Studies Papers*, Working Paper 2. Fourth Series, January, Bradford: University of Bradford.
Ropers, Norbert 1997. *Roles and Functions of Third Parties in the Constructive Management of Ethnopolitical Conflicts*, Berlin: Berghof Research Center for Constructive Conflict Management.
Ropers, Norbert 1998. "Towards a Hippocratic Oath of Conflict Management? Eight Critical Statements Relating to the Contribution of NGOs in Conflict Prevention and Conflict Transformation," *in* European Platform for Conflict Prevention, op. cit., 27–33.
Ropers, Norbert and Tobias Debiel (eds.) 1995. *Friedliche Konfliktbearbeitung in der Staatenund Gesellschaftswelt*, Bonn: Stiftung Entwicklung und Frieden.
Ross, Marc Howard and Jay Rothman (eds.) 1999. *Theory and Practice in Ethnic Conflict Management: Theorizing Success and Failure*, London: Macmillan Press.
Rubin, Jeffrey Z. 1980. "Experimental Research on Third-Party Intervention in Conflict," *Psychological Bulletin*, 87, 2, 379–391.

Rubin, Jeffrey Z., (ed.) 1981. *Dynamics of Third-Party Intervention: Kissinger in the Middle East*, New York: Praeger.

Rupensinghe, Kumar (ed.) 1995. *Conflict Transformation*, London: Macmillan.

Sandole, Dennis J.D. and Hugo van der Merwe (eds.) 1993. *Conflict Resolution Theory and Practice: Integration and Application*, Manchester and New York: Manchester University Press.

Scimecca, J. A. 1993 "Theory and Alternative Dispute Resolution. A Contradiction in Terms?" *in* Sandole and van der Merwe, op. cit., 211–221.

Schmid, Herman 1968. "Peace Research and Politics," Journal of Peace Research, 5, 3, 217–232.

Sharp, Gene 1973. *The Politics of Nonviolent Action*, Boston: Porter Sargent.

Simmel, Georg 1955. *Conflict and the Web of Group Affiliations*, New York: Free Press.

Stedman, Stephen J. 1991. *Peacemaking in Civil War: International Mediation in Zimbawe, 1974–1980*, Boulder, Co: Lynne Rienner.

Ury, William 1991. *Getting Past "No": Negotiating with Difficult People*, New York: Bantam Books.

Wall, J. and A. Lynn 1993. "Mediation: A Current Review," *Journal of Conflict Resolution* 37, 1, 160-194.

Weber, Max 1948. *The Theory of Social and Economic Organization*, Glencoe: The Free Press.

Webb, K, Koutrakou, V. N., and Walters, M. 1996. "The Yugoslavian Conflict, Europe Mediation and the Contingency Model: A Critical Perspective," *in* Bercovitch, op. cit., 171–189.

Weiss, Anja, 1999. "Rassistische Effekte unter antirassistisch engagierten MultiplikatorInnen. Zur interaktiven Reproduktion einer symbolisch vermittelten Dimension sozialer Ungleichheit." *Unpublished Doctorate Dissertation*, Humboldt Universität zu Berlin.

Wolfe, Alvin W. and Yang Honggang (eds.) 1996. A*nthropological Contributions to Conflict Resolution*, London: University of Georgia Press.

Woodhouse, Tom (ed.) 1991. *Peacemaking in a Troubled World*, Oxford: Berg Books.

Zartman, I. William 1985. *Ripe for Resolution: Conflict and Intervention in Africa*, New York: Oxford University Press.

Zartman, I. William 1987. *Positive Sum: Improving North-South Negotiations*, New York: Transaction Publishers.

Zartman, I. William (ed.) 1995. *Elusive Peace: Negotiating an End to Civil Wars*, Washington, DC: The Brookings Institution.

Zartman, I. William et. al. 1996. "Negotiation as a Search for Peace," *International Negotiation* 1, 79-98.

Zartman, I. William and Maureen Berman 1982. *The Practical Negotiator*, New Haven: Yale University Press.

Zartman, I. William and J. Lewis Rasmussen (eds.) 1997. *Peacemaking in International Conflict. Methods and Techniques*, Washington, DC: United States Institute for Peace.